වාර්ෂික වාර්තාව


ஆண்டறிக்கை

Annual Report

2023







පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
பாவனையாளர் அலுவல்கள் அதிகாரசபை
Consumer Affairs Authority

www.caa.gov.lk

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය
வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு, மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சு
Ministry of Trade, Commerce, Food Security and Co-operative Development

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

වාර්ෂික වාර්තාව - 2023

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

1 වන සහ 2 වන මහල, සී.ඩබ්.ඊ. ගොඩනැගිල්ල

අංක 27, වොක්ෂෝල් වීදිය

කොළඹ 02.

www.caa.gov.lk

පටුන

1. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය 4

1.1. දැක්ම, මෙහෙවර, ආයතනික ඉලක්ක සහ ආයතනික සාරධර්ම 5

1.2. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය 8

1.3. පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව 8

1.4. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අරමුණු සහ කාර්යභාරය 10

2. පරිපාලන රාමුව 12

2.1 අධිකාරියේ ව්‍යවස්ථාව 13

2.1.1 අධිකාරියේ සාමාජිකයන් 13

2.2 අධිකාරියේ කාර්ය මණ්ඩලය 13

3. සභාපතිතුමාගේ පණිවිඩය 16

4. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්යසාධනය 17

4.1 හානිකර මෙන්ම ප්‍රමිතියෙන් තොර භාණ්ඩ සහ සේවාවන්ගෙන් පාරිභෝගිකයින් ආරක්ෂා කරගැනීම 17

4.1.1 පනතෙහි 10 වන සහ 12 වන වගන්ති යටතේ නිකුත් කරන ලද විධාන 17

4.1.2 පනතෙහි 20(5) වගන්තිය යටතේ නිකුත් කරන ලද/ ඉවත් කරන ලද නියෝග 17

4.1.3 ප්‍රමිතියෙන් තොර ආනයනික භාණ්ඩ විමර්ශනය කිරීම 18

4.1.4 ජාතික කමිටු නියෝජනය කරමින් පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්ති/නීති හඳුන්වාදීම 18

4.2 වංචාකාරී කටයුතු සහ අසාධාරණ වෙළෙඳ පිළිවෙත් වලින් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම 18

4.2.1 ව්‍යාපාරික ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම 18

4.2.2 පාරිභෝගික දැනුවත්කිරීම සහ පාරිභෝගික සේවා කමිටු පිහිටුවීම 18

4.2.3 වෙළෙඳපොළ වැටලීම් සහ විමර්ශන 20

4.2.4 භාණ්ඩවල ගුණාත්මකභාවය සම්බන්ධයෙන් සිදුකරන ලද රසායනාගාර පරීක්ෂාවන් 25

4.3 අසාධාරණ වෙළෙඳ පිළිවෙත් මඟින් අගතියට පත් පාරිභෝගිකයින්ට සහන ලබාදීම 28

4.3.1 පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම 28

4.4 සාධාරණ මිල සහතික කිරීම 31

4.4.1 නිශ්චිත භාණ්ඩවල මිල නියාමනය 31

4.5 ආයතනයේ ධාරිතාවය වැඩිදියුණු කිරීම 34

4.5.1 අධිකාරියේ කාර්ය මණ්ඩලය ..... 34.

4.5.2 කාර්ය මණ්ඩල සංවර්ධනය 37

4.5.3 කාර්යමණ්ඩල අභිප්‍රේරණය සහ සුභසාධනය..... 38

4.5.4 පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත සංශෝධනය කිරීම. 38

4.6 පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව 38

5. විගණනය කළ මූල්‍ය වාර්තාව 39

6. විගණකාධිපති වාර්තාව..... 51

7. විගණකාධිපති වාර්තාවේ කරුණු සම්බන්ධ සභාපතිතුමාගේ නිරීක්ෂණ හා යෝජිත ක්‍රියාමාර්ග 60

1. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

1979 අංක 1 දරන පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ පනත, 1987 අංක 1 දරන සාධාරණ වෙළඳ කොමිෂන් සභා පනත සහ (173 වන අධිකාරිය වූ) මිල පාලනය කිරීමේ පනත අවලංගු කරමින් පනවන ලද 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත මඟින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවන ලදී.

පනතෙහි පූර්විකාව අනුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සමස්ත අරමුණ වන්නේ වෙළෙඳාම හා භාණ්ඩ සහ සේවාවල මිල විධිමත් කිරීම මඟින් පාරිභෝගිකයින් වඩා හොඳින් ආරක්ෂා කිරීමත්, අසාධාරණ වෙළෙඳ පිළිවෙත් හා සීමිත වෙළෙඳ පිළිවෙත් වලින් වෙළෙන්දන් සහ නිෂ්පාදකයන් ආරක්ෂා කිරීමත්, හැකි කවර හෝ අවස්ථාවකදී තරඟකාරී මිල ප්‍රවර්ධනය කිරීමත් සහ භාණ්ඩ හා සේවා වෙළෙන්දන් හා නිෂ්පාදකයන් අතර යහපත් තරඟකාරීත්වයක් තිබීම සහතික කිරීමත්ය.

1.1 දැක්ම, මෙහෙවර, ආයතනික ඉලක්ක සහ ආයතනික සාරධර්ම

දැක්ම

සදාචාරාත්මක ව්‍යාපාරික පරිසරයක් තුළ මනාව සුරක්ෂිත වූ පාරිභෝගිකයෙකු බිහි කිරීම

මෙහෙවර

පාරිභෝගික සවිබල ගැන්වීම, වෙළෙඳාම විධිමත් කිරීම සහ යහපත් තරඟකාරීත්ව ප්‍රවර්ධනය තුළින් පාරිභෝගික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම.

ආයතනික ඉලක්ක

1. පනතෙහි විධිවිධාන සහ පරිචයන් තුළින් පාරිභෝගික අභිමතය ඉහළ නැංවීම සහ ආරක්ෂා කිරීම.
2. ආර්ථික සංකේන්ද්‍රණය පාලනය හෝ ඉවත් කිරීම සහ යහපත් තරඟකාරීත්වය ප්‍රවර්ධනය කිරීම.
3. පාරිභෝගිකයින් සහ වෙනත් පාර්ශවකරුවන් සඳහා අධ්‍යාපනය සහ දැනුවත්කිරීම් වැඩිදියුණු කිරීම.
4. සෞඛ්‍ය සම්පන්න සමාජයක් නිර්මාණයට අනුබල දීමට පර්යේෂණ සහ සංවර්ධන අධ්‍යයනයන් සිදුකිරීම.
5. ධාරිතා සංවර්ධනය තුළින් කැපවීමෙන් යුතු ශ්‍රම බලකායක් සංවර්ධනය කිරීම
6. අධිකාරියේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී පරිපාලන යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම.

ආයතනික සාරධර්ම

විශ්වසනීයත්වය

- කාර්යසාධන අනුකූලතාව පවත්වා ගැනීම හා විශ්වසනීයත්වය තහවුරු කිරීම.

අවංකභාවය හා සෘජුභාවය

- සියලුම කාර්යයන්හිදී අවංකවිම සාධාරණවිම සහ යුක්තිගරුකවීම.

වගකීමට බැඳී සිටීම

- විනිවිදභාවය ආරක්ෂා කිරීම, වගකිවයුතුබව සහ ඉටුකරනු ලබන සියලුම කාර්යයන් සම්බන්ධයෙන් වගකීම දැරීම.

ඇගයීම

- කාර්ය මණ්ඩලයේ විශිෂ්ට කාර්යඵල අගය කිරීම සහ ප්‍රශංසා කිරීම.

විශ්වසනීය ප්‍රතිචාර දැක්වීම

- සේවා සැලසීම සඳහා කැමැත්තක් දැක්වීම සහ සූදානම්වීම.

අරමුණු ලඟාකර ගැනීම සඳහා කැපවීම

- පවරා ඇති කාර්යයන් කැපවීමෙන් යුක්තව ඉටුකිරීම.

කණ්ඩායම් හැඟීම ගරු කිරීම

- අන්‍යෝන්‍ය අවබෝධය, එකිනෙකාට ගෞරව කිරීම සහ එකිනෙකා අතර විශ්වාසය ගොඩනැංවීම සහ මනා සන්නිවේදනය සහ නම්‍යශීලීභාවය වර්ධනය කරමින් පොදු ඉලක්කයන් ළඟා කර ගැනීම උදෙසා සියලුම සේවකයින් එක්ව කටයුතු කිරීම.

අඛණ්ඩ වැඩිදියුණු කිරීම

වඩාත් බලපෑම් සහිත ගැටළු කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සමඟ වැඩ කාර්ය සාධනය සමාලෝචනය කිරීම.

1.2 පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවීම හා සංයුතිය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සභාපතිවරයා සහ කර්මාන්ත ආර්ථික, වාණිජ්‍යය, පරිපාලනය, ගණකාධිකරණය, විද්‍යාව හෝ සෞඛ්‍ය යන ක්ෂේත්‍රයන්හි පිළිගත් සුදුසුකම් සහ පුළුල් අත්දැකීම් සහිත අවම වශයෙන් සාමාජිකයින් දස දෙනෙකුගෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සමන්විත වේ. සභාපතිවරයා සහ සාමාජිකයින් තිදෙනෙක් අධිකාරියෙහි පූර්ණ කාලීන සාමාජිකයෝ වෙති. අධිකාරියෙහි අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ සභාපතිවරයා සහ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින් විසින් ගනු ලැබේ. මෙම ප්‍රතිපත්තිමය තීරණ අධිකාරියෙහි ප්‍රධාන විධායක නිලධාරියා වන අධ්‍යක්ෂ ජනරාල් විසින් අධිකාරියෙහි මෙහෙයුම් අංශ මගින් ක්‍රියාත්මක කරනු ලැබේ.

අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය අවමය සාමාජිකයින් 10 කි . උපරිමය තීරණය වන්නේ අමාත්‍යවරයාගේ අනුමැතිය පරිදිය.

ආයතනයේ අංශ

1. අධ්‍යක්ෂ ජනරාල්
   - 1.1 අධ්‍යක්ෂ - පාරිභෝගික කටයුතු සහ තොරතුරු
   - 1.2 අධ්‍යක්ෂ - තරඟකාරිත්ව ප්‍රවර්ධනය
   - 1.3 අධ්‍යක්ෂ - නීති හා බලගැන්වීම්
   - 1.4 අධ්‍යක්ෂ - මිලකිරීම් හා කළමනාකරණ
   - 1.5 අධ්‍යක්ෂ - මානව සම්පත් හා පරිපාලන
   - 1.6 අධ්‍යක්ෂ - මූල්‍ය
2. අභ්‍යන්තර විගණක - ආයතනයේ සභාපතිවරයාට සෘජුවම වාර්තා කරනු ලැබේ.

1.3 පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව

පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ පනතේ IV වන කොටස යටතේ පිහිටුවන ලදී. වාණිජ්‍ය, නීතිය, ව්‍යවසාය කළමනාකරණය සහ වෙළෙඳ පරිවයන් හා පාරිභෝගික කටයුතු යන ක්ෂේත්‍රයන්හි පුළුල් අත්දැකීම් සහිත සාමාජිකයින් තිදෙනෙකුගෙන් එය සමන්විත වේ.

සභාවෙහි සියලුම ලේඛන සහ රැස්වීම් කටයුතු සහ සභාවට අවශ්‍ය දැන්වීම් බාහිර පාර්ශවයන් වෙත යැවීම සම්බන්ධයෙන් වගකීම් දරන ලේකම්වරයකුගෙන්ද සභාව සමන්විත වේ. අසා නිශ්චය කිරීම සභාවෙහි කටයුතු වන අතර සියලුම ඉල්ලීම් සහ යොමු කිරීම් පනතෙහි 19,20,21,22,37, සහ 38 වගන්ති ප්‍රකාරව සිදු කරනු ලැබේ.

ආයතන සංවිධාන ව්‍යුහය
අධ්‍යක්ෂ මණ්ඩලය (පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය)
පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව
සභාපති සහ සාමාජිකයින්
සභාපති සහ පූර්ණ කාලීන සාමාජිකයින්
අධ්‍යක්ෂ ජනරාල් (ප්‍රධාන විධායක නිලධාරී)
පාරිභෝගික සහවේ ලේකම්
අභ්‍යන්තර විගණක
විගණන නිලධාරී
අධ්‍යක්ෂ (පරිපාලන සහ මානව සම්පත්)
සහකාර අධ්‍යක්ෂ (සම සභාපතිවරිය)
(කොන්ත්‍රාත්)
සහකාර අධ්‍යක්ෂ/ නිලධාරිය අධ්‍යක්ෂ (පරිපාලන සහ මානව සම්පත්)
ජ්‍යෙෂ්ඨ ලේකම් (සභාපති/ අධ්‍යක්ෂ මණ්ඩල)
ජ්‍යෙෂ්ඨ පරිපාලන සහ මානව සම්පත් නිලධාරී
පරිපාලන නිලධාරී
මාධ්‍ය නිලධාරී (කොන්ත්‍රාත්)
ඉංජිනේරු ශිල්පී (කොන්ත්‍රාත්)
පුස්තකාල සායකයින්
පුහුණු ප්‍රායෝගික
කළමනාකාර සහකාර
කාර්යාල කාර්ය සහායක
කාර්යාල කාර්ය සහායක
කාර්යාල කාර්ය සහායක
අධ්‍යක්ෂ (මූල්)
සහකාර අධ්‍යක්ෂ/ නිලධාරිය අධ්‍යක්ෂ (මූල්)
ජ්‍යෙෂ්ඨ ගිණුම් නිලධාරී
ජ්‍යෙෂ්ඨ ඵල්දායී පරිපාලක
ගිණුම් නිලධාරී
දත්ත සම්බන්ධීකාරක
ගෙවුම් නිලධාරී / කළමනාකරණ සහකාර
කළමනාකාරණ සහකාර
කාර්යාල කාර්ය සහායක
කාර්යාල කාර්ය සහායක
අධ්‍යක්ෂ (මිල කිරීම හා කළමනාකරණ)
සහකාර අධ්‍යක්ෂ/ නිලධාරිය අධ්‍යක්ෂ (මිල කිරීම හා කළමනාකරණ)
ජ්‍යෙෂ්ඨ පිරිපැහැ නිලධාරී
පිරිපැහැ නිලධාරී
කළමනාකාරණ සහකාර
කාර්යාල කාර්ය සහායක
අධ්‍යක්ෂ (රාජකාරිවල භූවර්ධන)
සහකාර අධ්‍යක්ෂ/ නිලධාරිය අධ්‍යක්ෂ (රාජකාරිවල භූවර්ධන)
ජ්‍යෙෂ්ඨ වෙළෙඳපොල පර්යේෂණ විශ්ලේෂක
වෙළෙඳපොල පර්යේෂණ විශ්ලේෂක
ජ්‍යෙෂ්ඨ සංවිධායක නිලධාරී
සංවිධායක නිලධාරී
කළමනාකාරණ සහකාර
කාර්යාල කාර්ය සහායක
අධ්‍යක්ෂ (නීති සහ බලපෑම්)
සහකාර අධ්‍යක්ෂ/ නිලධාරිය (නීති සහ බලපෑම්)
නීති සහ බලපෑම් නිලධාරී/ ජ්‍යෙෂ්ඨ නීති නිලධාරී
කළමනාකාරණ සහකාර
කාර්යාල කාර්ය සහායක
අධ්‍යක්ෂ (පාරිභෝගික කටයුතු හා හොයුරු)
සහකාර අධ්‍යක්ෂ/ නිලධාරිය අධ්‍යක්ෂ (ප්‍රාදේශීය කටයුතු)
ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී
විමර්ශන නිලධාරී
කළමනාකාරණ සහකාර
කාර්යාල කාර්ය සහායක
සහකාර අධ්‍යක්ෂ/ නිලධාරිය (පාරිභෝගික කටයුතු හා හොයුරු)
ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී
විමර්ශන නිලධාරී
කාර්යාල කාර්ය සහායක

1.4 පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අරමුණු සහ කාර්යභාරය

1979 අංක 1 දරන පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ පනත, 1987 අංක 1 දරන සාධාරණ වෙළෙඳ කොමිෂන් සභා පනත සහ (173 වන අධිකාරිය වූ) මිල පාලනය කිරීමේ පනත අවලංගු කරමින් පනවන ලද 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත මඟින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවන ලදී.

2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ පනත ප්‍රකාරව අධිකාරියේ අරමුණු;

අ. පාරිභෝගිකයන්ගේ ජීවිත සහ දේපළවලට උපද්‍රවයක් සිදුවන භාණ්ඩ අලෙවි කිරීමට සහ සේවා සැපයීමට එරෙහිව පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම;

ආ. අසාධාරණ වෙළෙඳ පිළිවෙත්වලට විරුද්ධව පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සහ පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම්වලට නිසි සැලකිල්ල දැක්වීමට සහතික වීම;

ඇ. හැකි සෑම විටම පාරිභෝගිකයින්ට තරඟකාරී මිලකට භාණ්ඩ හා සේවාවලට ප්‍රමාණවත් ප්‍රවේශයක් ලබා දීමට සහතික වීම.

ඈ. අසාධාරණ වෙළෙඳ පිළිවෙත්, සීමිත වෙළෙඳ පිළිවෙත් හෝ වෙළෙන්දන් විසින් සිදු කරන වෙනත් යම් ආකාරයක පාරිභෝගික සූරාකෑම්වලට එරෙහිව සහන ලබා දීම.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සහ පාරිභෝගික කටයුතු පිළිබඳ සභාවේ කාර්යභාරය ඉහත ප්‍රධාන අරමුණු පදනම් කරගෙන ඇති අතර, ඒ පිළිබඳව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතෙහි 8 වන වගන්තියේ කර ඇති විස්තරය පහත පරිදි වේ.

(අ) (i) ව්‍යවසායන් අතර සීමාකාරී ගිවිසුම් ;

(ii) ව්‍යවසායන් අතර මිල පිළිබඳ වැඩ පිළිවෙලවල් ;

(iii) වෙළෙඳපොළ ඇතුළත හෝ වෙළෙඳපොළේ සැලකිය යුතු කොටසක දේශීය වෙළෙඳාම හෝ ආර්ථික සංවර්ධනය පිළිබඳ වූ ආධිපත්‍ය තත්ත්වයක් අනිසි ලෙස යොදා ගැනීම ; හෝ

(iv) දේශීය හෝ ජාත්‍යන්තර වෙළෙඳාමට හෝ ආර්ථික සංවර්ධනයට අහිතකර ලෙස බලපාන තරඟකාරිත්වය පිළිබඳ යම් අවහිරයක්

පාලනය කිරීම හෝ ඉවත් කිරීම;

(ආ) තරඟ විරෝධී හා ආධිපත්‍ය තත්ත්වයන් අනිසි ලෙස යොදාගැනීම පිළිබඳ විමර්ශන හෝ පරීක්ෂණ කිරීම;

(ඇ) භාණ්ඩ හෝ සේවා සපයන තැනැත්තන් අතර ඵලදායී තරඟකාරිත්වය පවත්වා ගැනීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ඈ) භාණ්ඩ හා සේවාවල මිල, ඒවා ලබා ගතහැකිවීම සහ ඒවායේ තත්ත්වය සහ සපයන වර්ගය සම්බන්ධයෙන් පාරිභෝගිකයින්ගේ, මිලදී ගන්නන්ගේ සහ භාණ්ඩ හා සේවා භාවිතා කරන අයගේ අයිතිවාසිකම් සහ සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම;

(ඉ) මිලදී ගැනීමට තබා ඇති භාණ්ඩ සහ සේවාවල තත්ත්වය, ප්‍රමාණය, ශක්තිය, පිරිසිදුකම, ප්‍රමිති සහ මිල පිළිබඳව පාරිභෝගිකයින් දැනුවත් කිරීම;

(ඊ) මෙම පනතේ නිශ්චිතව සඳහන් කර ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් විමර්ශන සහ පරීක්ෂණ පැවැත්වීම;

(උ) වෙළඳපොළ තරහකාරීත්වය අඩු ඵලදායීත්වයෙන් පවතින අවස්ථාවලදී වෙළඳපොළෙහි තරහකාරී මිල ප්‍රවර්ධනය කිරීම;

(ඌ) වෙළඳපොළ තත්ත්වය සහ පාරිභෝගික කටයුතුවලට අදාළව අධ්‍යයන භාර ගැනීම, වාර්තා පළ කිරීම සහ මහජනතාවට තොරතුරු සැපයීම;

(එ) රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ කාර්යක්ෂමතාව පිළිබඳ අධ්‍යයන භාරගැනීම;

(ඒ) පාරිභෝගිකයින්ගේ මනා සෞඛ්‍යය ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් පාරිභෝගික අධ්‍යයනය ප්‍රවර්ධනය කිරීම;

(ඔ) වෙළඳපොළ තත්ත්වය සහ පාරිභෝගික කටයුතු පිළිබඳ තොරතුරු වෙනත් ආයතන සමඟ හුවමාරු කිරීම ප්‍රවර්ධනය කිරීම;

(ඕ) පාරිභෝගික සංවිධාන පිහිටුවීම, ප්‍රවර්ධනය කිරීම, උපකාර කිරීම සහ උනන්දු කිරීම;

(ක) අධිකාරිය විසින් ලබා දෙනු ලබන යම් සේවාවන් සම්බන්ධයෙන් ගාස්තු අය කිරීම;

(ග) අධිකාරියේ කර්තව්‍යයන් ඉටුකිරීමේ පහසුකම් සැලැස්වීමට අවශ්‍ය විය හැකි පරිදි කිසියම් ආකාරයක කමිටුවක් හෝ කමිටු පත් කිරීම; සහ

(ව) අධිකාරියේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා සහ අධිකාරියේ කර්තව්‍යය ඵලදායී ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය වෙනත් සියලු කටයුතු ඉටුකිරීම.

2. පරිපාලන රාමුව

2.1 අධිකාරියේ ව්‍යවස්ථාව

පනතේ විධිවිධාන ප්‍රකාරව,අධිකාරිය සමන්විත වන්නේ පනතේ නිශ්චිතව දක්වා ඇති සුදුසුකම් සහ පළපුරුද්ද ඇති පුද්ගලයන් අතරින් අමාත්‍යවරයා විසින් පත් කරන ලද සභාපතිවරයෙකු සහ තවත් සාමාජිකයින් දස දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකිනි.

2.1.1 අධිකාරියේ සාමාජිකයන්

2023 වසර අවසන් වන විට නිලතල දැරූ සාමාජිකයින්ගේ නම් පහත පරිදි වේ.

1	සිසිර ශාන්ත නිරිඇල්ල මහතා	සභාපති	
2	සාලිය සරත් කුමාර මහතා	පූර්ණ කාලීන සාමාජික	
3	ඩබ්ලිව් ඩබ්ලිව් ඒ බස්නායක මහතා	පූර්ණ කාලීන සාමාජික	
	එස්.ඒ.එච් ලලිත් ආර් ද සිල්වා මහතා	පූර්ණ කාලීන සාමාජික	2023.05.19 දක්වා
	ජේ.එම්.සී ජයන්ති විජේතුංග මිය	පූර්ණ කාලීන සාමාජික	2023.06.16 සිට
	පී.එම්.කේ.හෙට්ටිආරච්චි මහතා	භාණ්ඩාගාර නියෝජිත	
	ඩබ්.කේ.ඩී.ඩන්ස්ටන් මහත්මිය	භාණ්ඩාගාර නියෝජිත /නිරීක්ෂක	
	එච්. සරත් කුමාර පෙරේරා මහතා	සාමාජික	
9	පූජ්‍ය මාදූවේ ශාන්ත හිමි	සාමාජික	
10	ගරු ඇන්තනි සිරිල් පියතුමා	සාමාජික	
	කේ.කේ.නාත් ඩික්සන් මහතා	සාමාජික	
	එල්. ලුවිස් මැතුවෙල් ප්‍රනාන්දුපුල්ලේ මහතා	සාමාජික	
13	මාර්ෂල් මාකස් පීරිස් පුල්ලේ මහතා	සාමාජික	
14	සී එස් නිශාන්ත සිල්වා පුල්ලේ මහතා	සාමාජික	
	එම්.ඩබ්ලිව්.ඒ.සී විජේසූරිය මහතා	සාමාජික	
	ආචාර්ය එන්. තිවංක ද සිල්වා	සාමාජික	
	ජේ. ඒ දොන් ෆ්‍රැන්සිස් උපතිස්ස මහතා	සාමාජික	
	එම්.එස්.වී ලක්ෂ්මන් සමරවීර මහතා	සාමාජික	
19	නිපුන් සමරතුංග මහතා	සාමාජික	2023.08.03 සිට
	ඩබ්ලිව්. ඒ. ගාමිණී ප්‍රනාන්දු මහතා	සාමාජික	2023.04 දක්වා.
21	අතිපූජ්‍ය නැදගමුවේ විජයමෛත්‍රී හිමි	සාමාජික	2023.07 දක්වා.

2.2 අධිකාරියේ කාර්ය මණ්ඩලය.

ශාන්ත නිරිඇල්ල මහතා තවදුරටත් සභාපතිවරයා ලෙස කටයුතු කළ අතර එස්.එම් පෙත්තාවඩු මහත්මිය 2023.01.25 සිට 2023.03.07 දක්වා වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් ධූරය ද, ජේ.එම්.සී.ජයන්ති විජේතුංග මහත්මිය අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ (වැඩබලන) 2023.03.08 දින සිට 2023.06.15 දක්වා ද කටයුතු කරන දරන. එස්.එම් පෙත්තාවඩු මහත්මිය 2023.07.06 සිට අධ්‍යක්ෂ ජනරාල්වරිය ලෙස කටයුතු කරන ලදී.

අධිකාරියේ අංශ ප්‍රධානීන්

ඩබ්ලිව්.එම් ප්‍රියන්ත මහතා
MPM, B.Com (Sp)Hons, AIPFM, DPFM
අධ්‍යක්ෂ - මූල්‍ය

ඩබ්ලිව්.ඒ.කේ බණ්ඩාර මහතා
B.Sc (තක්සේරු) Sp. MBA (UK), LLB (UK)
අධ්‍යක්ෂ - පාරිභෝගික කටයුතු සහ තොරතුරු

සමන්තා කරුණාරත්න මිය

B.A (Econ) Sp (Hons), M. A. (Economics)

අධ්‍යක්ෂ - තරඟකාරීත්ව ප්‍රතිපත්තිය

නිරංජලා ජෙගනාදන් මෙනවිය

ACA, MBA (ජ'පුර)

අධ්‍යක්ෂ - මිලකිරීම් හා කළමනාකරණ

අමිතා සෝමවීර ජයතුංග මහත්මිය

නීතිපති (කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, නීතිවේදී උපාධිය (කොළඹ)

අධ්‍යක්ෂ - නීති සහ බලාත්මක කිරීම

සම්පත් අතුළුගහ මහතා

B. Com (Sp) Hons, MBA, MIM (SL), AIPM (SL), AUKAP, PG Dip in Pers & HRM, Dip in PM

අධ්‍යක්ෂ - මානව සම්පත් සහ පරිපාලන

ලාල් හේවාපතිරණ මහතා,

SLAS

අධ්‍යක්ෂ - මානව සම්පත් සහ පරිපාලන (වැඩ බලන)

රසිකා සාවිත්‍රී විජේසේකර මිය

B.Sc ගිණුම්කරණය (Sp) Hons. USJ,

MBA (UK), TQM (Dip), CBA, MAAT

අභ්‍යන්තර විගණක

සංජය ඉරසිංහ මහතා

අධ්‍යක්ෂ - වැටලීම් සහ විශේෂ විමර්ශන

පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව

වාණිජ නීති, ව්‍යාපාරික ව්‍යවසාය කළමනාකරණය, වෙළෙඳ පිළිවෙත් සහ පාරිභෝගික කටයුතු පිළිබඳ පුළුල් පළපුරුද්දක් ඇති විශේෂඥයින් තිදෙනෙකුගෙන් මෙම සභාව පිහිටුවා ඇත. එම සභාව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් කරන ලද සියලුම ඉල්ලීම් කෙරෙහි යොමු වී තීරණ ගත යුතුය. මීට අමතරව, 38 වගන්තිය යටතේ තරහකාරී විරෝධී හැසිරීම් සම්බන්ධ පැමිණිලි විමර්ශනය කිරීම සහ තීරණ ගැනීම, 19 වගන්තිය යටතේ උපරිම සිල්ලර මිල නියම කිරීම සහ පනතේ 19 සහ 20 වගන්ති යටතේ අනිසි මිල ගණන් සම්බන්ධයෙන් චෝදනා කිරීම පිළිබඳ වගකීමට බැඳී සිටියි.

<u>පාරිභෝගික කටයුතු පිළිබඳ සභාවේ සාමාජිකයින්</u>

රඹිත අබේගුණවර්ධන මහතා	- සභාපති
ශිරන්ත හීන්කෙන්ද මහතා	- සාමාජික
මහේෂ් අමරසිරි මහතා	- සාමාජික (2021.01.01-2023.01.31)
ආචාර්ය ප්‍රීති කනකරත්න මහතා	- සාමාජික (2023.04.26 සිට)
කුමුදු මීගහගේ මහතා	- සභාවේ ලේකම් (වැඩබලන)

3. සභාපතිතුමාගේ පණිවිඩය

2023 වර්ෂය සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉමහත් තෘප්තියෙන් යුතුව ඉදිරිපත් කරමි. 2003 අංක 9 දරන පනත යටතේ ස්ථාපිත කරන ලද පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය එහි පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, සාධාරණ තරඟකාරිත්වය ප්‍රවර්ධනය කිරීම සහ ගුණාත්මක භාණ්ඩ හා සේවා ලබා ගැනීම සහතික කිරීම මෙහෙවරෙහි නියැලී සිටියි.

පසුගිය වර්ෂය තුළ අපගේ ක්‍රියාකාරකම්හි සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කර ඇත. දිස්ත්‍රික් කාර්යාල 25 ක කැපවීමෙන් ක්‍රියා කළ නිලධාරීන් විසින් වැරදි සහගත ලෙස වෙළෙඳාම් ක්‍රියාවෙහි නිරත වූ වෙළෙඳුන් සොයා කළ වැටලීම් වලින් සාර්ථක වැටලීම් 22,913 ක් සිදු කොට රුපියල් මිලියන 273.15 ක දඩ මුදලක් අය කරගැනිමට සමත් විය.මේ හා සමගාමිව සාමාන්‍ය ජනතාව, පාසල් සිසුන් සහ වෙළඳුන් ඉලක්ක කර ගනිමින් පුළුල් පාරිභෝගික දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කොට පාරිභෝගිකයින්ගේ දැනුම බලාත්මක කිරීමට කටයුතු කරන ලදී.

පාරිභෝගික පැමිණිලි සඳහා ක්‍රියාත්මක විම තුළින් අපගේ ක්‍රියාශීලී ප්‍රවේශය හා පාරිභෝගික ආරක්ෂාව සඳහා අධිකාරියේ කැපවීම තවදුරටත් අවධාරණය කෙරේ. අපි ප්‍රමිතියෙන් තොර භාණ්ඩ, දෝෂ සහිත සේවා සහ අසාධාරණ වෙළෙඳ පිළිවෙත් සම්බන්ධ පැමිණිලි රාශියක් විමර්ශනය කළෙමු. ඒ අනුව, ඉතා කඩිනම් විමර්ශනයන් මඟින් අප විසින් අගතියට පත් පාරිභෝගිකයින් සඳහා වන්දි හෝ ප්‍රතිස්ථාපන තුළින් පාරිභෝගිකයා සුරක්ෂිත කර ඇත.

බිම් මට්ටමේ පාරිභෝගිකයා සවිබල ගැන්වීම හා වැඩි දියුණු කිරීම සඳහා දිවයින පුරා පාරිභෝගික සේවා කමිටු 337ක් ස්ථාපිත කළෙමු. දේශීය පාරිභෝගික ගැටලු විසඳීමට සහ කාලීන විසඳුම් සඳහා පහසුකම් සැළසීමට මෙම කමිටු තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරනු ලබයි.තරඟකාරී විරෝධී භාවිතයන්ට එරෙහි ක්‍රියාකාරකම්වල දී අධිකාරිය අප්‍රමාදව කටයුතු කරයි. වෙළඳපල ගතිකත්වය නිරීක්ෂණය කරමින් සහ පනතේ අදාළ විධිවිධාන බලාත්මක කිරීමෙන්, ව්‍යාපාර සහ පාරිභෝගිකයින් සඳහා එක හා සමාන පරිසරයක් සලසාදිමට උත්සාහ කරන්නෙමු.

මෙම ප්‍රධාන කාර්යයන්ට අමතරව අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල හා වෙළඳපල තුළ භාණ්ඩ සුලබත්වය /දුලභත්වය පිළිබඳ දත්ත එක්රැස් කරමින් ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීමට පියවර ගෙන තිබේ. තවද, හානිකර ආහාර නිෂ්පාදනවලින් පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සඳහා තත්ත්ව පාලන පියවරයන් ද අප විසින් ක්‍රියාත්මක කර ඇත. අධිකාරියේ සමස්ත කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ කාර්යක්ෂමතාවයට, නොසැලෙන කැපවීම සහ වෙහෙස මහන්සි වී වැඩකිරීම වෙනුවෙන් මගේ අවංක කෘතඥතාව පුද කරමි. තවද, පාරිභෝගිකයින්, ව්‍යාපාර සහ සිවිල් සමාජ සංවිධාන ඇතුළු අපගේ පාර්ශවකරුවන්ට ඔවුන්ගේ අඛණ්ඩ සහයෝගීතාවය වෙනුවෙන් මම ස්තුතිවන්ත වෙමි.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සෑමවිටම, සංකීර්ණ සහ අභියෝගාත්මක තත්ත්වයන් තුළ පවා සකස් වන, පාරිභෝගික අවශ්‍යතා සහ වෙළඳපල ගතිකත්වයට අනුගතව ක්‍රියා කරනු ඇත. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ලෙස අප, පාරිභෝගික අයිතීන් සුරැකෙන සහ සාධාරණ තරඟකාරිත්වයක් පවතින පාරිභෝගික හිතකාමී පරිසරයක් පෝෂණය කිරීමට ඇප කැප වී සිටිමු.

සභාපති
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

4. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්යසාධනය

2023 වර්ෂය තුළ පාරිභෝගික කටයුතු අධිකාරියේ කාර්ය සාධනය පහත පරිදි දැක්විය හැකිය.

4.1 හානිකර සහ ප්‍රමිතියෙන් බාල භාණ්ඩ හා සේවාවලින් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම

4.1.1 පනතේ 10 සහ 12 වගන්ති යටතේ නිකුත් කරන ලද විධාන.

නියෝග අංක	දිනය	ගැසට් පත්‍ර අංක	විස්තර	අරමුණ
88	2023.04.12	2304/35	නිෂ්පාදකයෙකු හෝ වෙළෙන්දකු විසින් ලිහිසි තෙල් හෝ ග්‍රීස් නිෂ්පාදනය හෝ ආනයනය කිරීම.	ලංකා ඛනිජ තෙල් සංස්ථාව නිකුත් කල අංක 1453/6 ඇති විශේෂ ගැසට් පත්‍රයේ නියමයන්ට අනුකූලව අධිකාරිය යටතේ ගිවිසුම් ගත වීම
89/90	2023.04.12	2304/36	සෘජු විකුණුම්කාර වෙළෙඳුන් අධිකාරියේ ලියාපදිංචි කිරීම සහ ජාල අලෙවිකරණයේ නිරත වන සමාගමක් හෝ අස්ථිත්වයක් අධිකාරියේ ලියාපදිංචි විය යුතු බව.	පාරිභෝගික ආරක්ෂාව තහවුරු කිරීම උදෙසා
91	2023.05.17	2332/15	ඕනෑම විද්‍යුත්-වාණිජ්‍ය අස්ථිත්වයක් හෝ අන්තර්ජාල වෙළෙඳ වේදිකා මෙහෙයුම්කරුවෙකු ඕනෑම භාණ්ඩයක් අලෙවිකරණයේදී සහ විකිණීමේදී පාරිභෝගිකයාගේ ආරක්ෂාව තහවුරු කිරීම.	
92	2023.06.01	2334/40	නියෝග 89/90 අවලංගු කිරීම	මහ බැංකුව මගින් නියාමනය සිදු කිරීම මත හා පනතේ ප්‍රතිපාදනයන්ට අනුකූල නොවීම මත

4.1.2 පනතේ 20(5) වගන්තිය යටතේ නිකුත් කරන ලද සහ ඉවත් කරන ලද නියෝග

නියෝග අංක	දිනය	ගැසට් අංක	විස්තර	අරමුණ
85	2023.01.20	2315/57	සුදු/රතු බිත්තර සඳහා උපරිම මිල.	වෙළෙඳ පොළ අයථා පරිදි භාවිතා කිරීමක් හෝ වෙනත් යම් වෙළෙඳ පොළ දෝෂයක් පවතින බව අධ්‍යක්ෂ ජනරාල්ට පෙනී යන අවස්ථාවක පාරිභෝගික ආරක්ෂාව ඇති කිරීම උදෙසා
86	2023.04.19	2328/05	බිත්තරයක් සඳහා උපරිම මිල / කි.ග්‍රෑම් (සුදු/රතු).	
87	2023.07.25	2342/23	86 නියෝගය අවලංගු කිරීම.	
88	2023.11.03	2356/39	සුදු සීනි සහ දුඹුරු සීනි සඳහා උපරිම සිල්ලර මිල.	
89	2023.11.21	2359/15	88 දරන නියෝගය අවලංගු කිරීම.	

පනතේ 18 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද නියෝග

නියෝග අංක	දිනය	ගැසට් අංක	විස්තර	අරමුණ
14	2023.06.16	2336/67	13 නියෝගය අවලංගු කිරීම	වෙළෙඳ පොළ අයථා පරිදි භාවිතා කිරීමක් හෝ වෙනත් යම් වෙළෙඳ පොළ දෝෂයක් පවතින බව අධ්‍යක්ෂ ජනරාල්ට පෙනී යන අවස්ථාවක පාරිභෝගික ආරක්ෂාව ඇති කිරීම උදෙසා
15	2023.06.16	2283/43	නියම කර ඇති භාණ්ඩ, තිරිඟු පිටි	

4.1.3 ප්‍රමිතියෙන් තොර ආනයනික භාණ්ඩ විමර්ශනය කිරීම

බාල තත්ත්වයේ භාණ්ඩ රටට ඇතුළුවීම, ඒවා රටට ඇතුළු වන ස්ථානයේදීම වළක්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ ශ්‍රී ලංකා රේගුව සමගින් සම්බන්ධීකරණය වී අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කර තිබේ. ආනයනික පරීක්ෂා කිරීමේ පටිපාටිය යටතේ සම්මතයන්ට අනුකූළ නොවීම හේතුවෙන් භාණ්ඩ ප්‍රති අපනයනය කළ යුතු බවට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිර්දේශ කරනු ලැබූ අවස්තාවන්හි දී එවන් සිදුවීම් අධීක්ෂණය කරන ලදි.

4.1.4 ජාතික කමිටු නියෝජනය කරමින් පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්ති/නීති හඳුන්වාදීම

සෞඛ්‍ය අමාත්‍යාංශය, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශය, බලශක්ති අමාත්‍යාංශය සහ ආර්ථික සංවර්ධනය සඳහා වන ජාතික සභාව යනා දී ආයතන යටතේ මෙහෙයවන ජාතික මට්ටමේ කමිටු තුළ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය නියෝජනය කරන අතර එමඟින් පාරිභෝගිකයින් ආරක්ෂාව සඳහා නව ප්‍රතිපත්ති සහ නීති හඳුන්වා දීමේ දී ඊට දායකත්වය සපයා තිබේ.

4.2 වංචාකාරී කටයුතු සහ අසාධාරණ වෙළෙඳ පිළිවෙත් වලින් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම

4.2.1 ව්‍යාපාරික ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

ව්‍යාපාරික ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් මඟින් දැනුම්වත්භාවය වර්ධනය කිරීම තුළින් අවදානමට ලක්වූ කණ්ඩායම් ආරක්ෂා කිරීම, සවිබලගැන්වීම, තරඟකාරිත්වය ප්‍රවර්ධනය සඳහා වන වඩාත් ප්‍රබල ක්‍රමවේදයයි. සැලසුම් කරන ලද සහ සම්පාදනය කරන ලද වෙළෙඳුන් දැනුවත් කිරීමේ වැඩසටහන් හරහා මෙය ක්‍රියාවට නංවා තිබේ.
2023 වර්ෂය තුළදී ව්‍යාපාරික ප්‍රජාව අරමුණු කරගෙන අධිකාරිය විසින් වැඩසටහන් 495ක් ක්‍රියාත්මක කර තිබේ.

4.2.2 පාරිභෝගික දැනුම්වත් කිරීම සහ පාරිභෝගික සේවා කමිටු පිහිටුවීම

මෙම අධිකාරියේ පාරිභෝගික දැනුම්වත් කිරීමේ ඒකකයෙන්, පාරිභෝගිකයින් සහ වෙළෙඳුන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලැබේ. සාමාන්‍ය ජනතාව සහ පාසල් සිසුන්, පාරිභෝගිකයින් ලෙස ඔවුන්ගේ අයිතිවාසිකම් සහ වෙළෙඳාමේ දී පාරිභෝගික අයිතීන් උල්ලංඝනය වන විට ඔවුන් ආරක්ෂා කර ගත හැකි ක්‍රම පිළිබඳව දැනුම්වත් කිරීම මෙම ඒකකයේ අරමුණ වේ.

දැනුම්වත් කිරීමේ ඒකකය මඟින් වෙළෙඳ දැනුම්වත් කිරීම හරහා අධිකාරී පනතට අනුව අනුගමනය කළ යුතු නීති රීති පිළිබඳව වෙළෙන්දන්, නිෂ්පාදකයින්, විකුණුම්කරුවන් සහ බෙදාහරින්නන් දැනුම්වත් කිරීම සිදු කෙරේ. ඔවුන් විසින් අනුගත විය යුතු පාරිභෝගික පනත යටතේ අලුතින් නිකුත් කළ ගැසට්පත්‍ර ගැන ද දැනුම්වත් කර ඇත. තවද ජංගම වෙළෙඳ දැනුම්වත් කිරීම් මඟින් වෙළෙඳසැල් සහ වෙළෙඳ ආයතන පරීක්ෂා කර වැරදි නිවැරදි කර ගැනීමට උපදෙස් ලබා දී ඇත. මෙම දැනුම්වත් කිරීමේ වැඩසටහන් භාෂා ත්‍රිත්වයෙන්ම දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබයි.
ඉහත සඳහන් කළ දැනුම්වත් කිරීම්වලට අමතරව, ජාතික මට්ටමේ ප්‍රදර්ශන ඔස්සේ මහජනතාව සමඟ සම්බන්ධ වී සිදු කරනු ලැබූ සියලු දැනුම්වත් කිරීමේ වැඩසටහන් විස්තර පහත පරිදි දැක්වේ.

දැනුම්වත් කිරීමේ වැඩසටහන් සාරාංශය

දිස්ත්‍රික්කය	මහජන	පාසල්	වෙළෙඳ	ජාතික මට්ටමේ ප්‍රදර්ශන	ජංගම දැනුම්වත් කිරීම්		විශේෂ දැනුම්වත් කිරීම්	පාසල් පාරිභෝගික කඩ	පාරිභෝගික සේවා කම්ටු නියෝජිතයන්ගේ සාම්පල නියැදි පරීක්ෂා කිරීම		මාධ්‍ය	
					වෙළෙඳ	පාරිභෝගික					ඉලෙක්ට්‍රොනික	සමාජ
අම්පාර	22	24	9		4	3			3	12		
අනුරාධපුර	27	3	10		86	10						
බදුල්ල	30	7	1		13	3				3		
මඩකලපුව	6	30			5	4						
ප්‍රධානකාර්යාලය (කොළඹ)	27	18	4	6	3	3	22			48	7	20
දිස්ත්‍රික්කාර්යාලය (කොළඹ)	11		3		9	3				28		
ගාල්ල	11	2	5	1	6	2				1		
ගම්පහ	18	5	4	1	10	1				19		
හම්බන්තොට	4	1	4		13	1						
යාපනය	8	2			10	2				6		
කළුතර	13	3			17					2		
මහනුවර	36	13	2		13	1		4	2	3		
කෑගල්ල	19	4	13	2	17	6						
කිලිනොච්චිය	5				14	1						
කුරුණෑගල	26	8	3		14	8			3	4		
මන්නාරම	2	2			17	2						
මාතලේ	5	6	6		15	1						
මාතර	10	2	3	1	2	1				1	1	
මොනරාගල	3	2			9	4						
මුලතිව්	12	5			26	5		1				
නුවර එළිය	8	4	1		35	1						
පොලොන්නරුව	6	3	1		3	3				4		
පුත්තලම	10	4	1	1	16	2				1		
රත්නපුරය	11		2		15	3			4	1		
ත්‍රිකුණාමලය	5	7	1		18	4						
වවුනියාව	8	4			32	6						
මුළු එකතුව	**343**	**159**	**73**	**12**	**422**	**80**	**22**	**5**	**12**	**133**	**8**	**20**
වාර්ෂික ඉලක්කය	**150**	**50**	**25**	**2**	**100**		**N/T**	**N/T**	**N/T**	**100**	**N/T**	**N/T**
ප්‍රතිශතය	**229%**	**318%**	**292%**	**600%**	**502%**		**N/T**	**N/T**	**N/T**	**133%**	**N/T**	**N/T**

දැනුම්වත් කිරීමේ වැඩසටහන් සාරාංශය(මාසිකව)

මාසය	පොදු මහජනතාව	පාසල්	වෙළෙඳ	ප්‍රදර්ශන	ජංගම		විශේෂ දැනුවත් කිරීම්	පාසල් පාරිභෝගික කව	පාරිභෝගික සේවා කමිටු කියාකාරකම්	එකතුව
					වෙළෙඳ	පාරිභෝගික				
ජනවාරි	984	132	132	0	529	1200	0	0		2977
			0	5500	644	876	0	0		7832
මාර්තු	1052	213	314	750	1836	605	200	0		4970
අප්‍රේල්	733	116	141	1825	704	6028	0	0		9547
මැයි	3201	886	112	0	413	1764	58	0		6434
ජූනි	5255	417	215	0	534	50	313	0		6784
ජූලි	1304	3374	179	450	8233	450	207	9		14206
අගෝස්තු	2089	1725	485	8500	5087	400	40	0		18326
සැප්තැම්බර්	1886	2702	497	5200	575	364	116	0		11340
ඔක්තෝබර්	1139	1413	317	3900	481	920	62	0		8232
නොවැම්බර්	1895	2053	262	0	1988	7679	74	0	134	14085
දෙසැම්බර්	1187	1201	307	11050	440	315	0	0	83	14583
මුළු එකතුව										**119316**

*ඉහත සඳහන් තොරතුරු අදාළ වන්නේ සහභාගිවන්නන් සංඛ්‍යාව ගණනය කළ හැකි දැනුම්වත් කිරීමේ වැඩසටහන් සඳහා පමණි. විද්‍යුත්, මුද්‍රිත සහ සමාජ මාධ්‍ය ඔස්සේ පවත්වන ලද දැනුම්වත් කිරීමේ වැඩසටහන් ඔස්සේ දැනුම්වත් වූ පිරිස ගණනය කළ නොහැකි බැවින් මෙහි එම තොරතුරු ඇතුළත් නොවේ.

පාරිභෝගික සේවා කමිටු

පාරිභෝගික සේවා කමිටු දිවයින පුරා දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් පිහිටුවා ඇත. කමිටුවේ සභාපති ප්‍රාදේශීය ලේකම්/සහකාර දිසාපති වන අතර කමිටුවේ කැඳවුම්කරු අධිකාරියේ අදාළ දිස්ත්‍රික් කාර්යාලයේ විමර්ශන නිලධාරියකු වේ. පාරිභෝගික කමිටුව පිහිටුවීමේ අරමුණ වන්නේ ප්‍රදේශය තුළ පාරිභෝගික සහන කටයුතු සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම සඳහා වේ. 2023 වසරේ ස්ථාපිත පාරිභෝගික සේවා කමිටු සංඛ්‍යාව 337 කි.

4.2.3 වෙළඳපොළ වැටලීම් සහ විමර්ශන

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතෙහි විධිවිධාන අනුව භාණ්ඩවල ලේබලයෙහි උපදෙස් ප්‍රදර්ශනය කිරීම උල්ලංඝණය කිරීම, භාණ්ඩයේ සඳහන් මිලට වඩා වැඩි මිලකට අලෙවි කිරීම, භාණ්ඩ අලෙවි කිරීම ප්‍රතික්ෂේප කිරීම, භාණ්ඩ සන්තකයෙහි තබාගැනීම හා විකිණීම ප්‍රතික්ෂේප කිරීම, භාණ්ඩ සඟවා තබා ගැනීම, අධිකාරියෙහි පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව යම් භාණ්ඩවල සිල්ලර හෝ තොග මිල ඉහළ දැමීම, මිල දර්ශන ප්‍රදර්ශනය නොකිරීම, මිලදී ගන්නන් සඳහා කුවිතාන්සි නිකුත් නොකිරීම, නොමඟ යැවීම හෝ වංචාකාරී කටයුතු සිදු කිරීම හෝ නිෂ්පාදකයින්/වෙළඳුන් විසින් සිදු කරන ලද ව්‍යාජ නියෝජන සම්බන්ධ වැටලීම් කිරීම සහ විමර්ශනය කිරීම, වංචාකාරී වෙළඳුන්ට අදාළව පනතෙහි 60 වන වගන්තියෙහි විධිවිධාන අනුව මහේස්ත්‍රාත් අධිකරණයන්හි නඩු පැවරීම සහ දඩ මුදල් නියම කිරීම සිදු කරනු ලැබේ.

දිස්ත්‍රික් අනුව සිදුකරන ලද වැටලීම්

පළාත	දිස්ත්‍රික්කය	ජන	පෙබ	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝ	සැප්	ඔක්	නොවැ	දෙසැ	මුළු
		වැටලීම්	වැටලීම්	වැටලීම්	වැටලීම්	වැටලීම්	වැටලීම්	වැටලීම්	වැටලීම්	වැටලීම්	වැටලීම්	වැටලීම්	වැටලීම්	
බටහිර	කොළඹ	60	116	146	154	110	146	169	87	130	146	152	106	1,522
	ප්‍රධාන කාර්යාලය													338
	ප්‍රධාන කාර්යාලය													125
	ප්‍රධාන කාර්යාලය													121
	ගම්පහ													1,190
	කළුතර	38	32							58				700
දකුණු	ගාල්ල									75				866
	මාතර									100				1,111
	හම්බන්තොට									67				521
සබරගමුව	රත්නපුරය									76				902
	කෑගල්ල													1,378
මධ්‍යම	මහනුවර													1,629
	මාතලේ	60												882
	නුවර එළිය													727
උතුරු මැද	අනුරාධපුර													1,501
	පොලොන්නරුව			57	60				43				54	662
උතුරු	යාපනය												109	888
	වවුනියාව										89	97	87	778
	මුලතිව්										48	44	52	504
	මන්නාරම										53	50	56	492
	කිලිනොච්චිය										35	31	41	429
ඌව	බදුල්ල										50	44	49	619
	මොනරාගල	24	20	60	63	60	67	52	48	47	47	50	53	591
නැගෙනහිර	ත්‍රිකුණාමලය	48	50	58	72	66	77	71	75	75	76	78	84	830
	අම්පාර	75	69	78	86	89	95	95	99	100	111	105	115	1,117
	මඩකලපුව	63	18	32	82	79	88	86	89	87	88	95	113	920
වයඹ	කුරුණෑගල	0	120	149	150	151	219	227	217	218	216	173	237	2,077
	පුත්තලම	75	72	90	97	94	160	162	160	130	128	106	154	1,428
මුළු එකතුව		1,294	1,360	1,887	2,236	2,018	2,420	2,348	2,170	2,299	2,399	2,220	2,197	24,848


දිස්ත්‍රික් අනුව ගොඇසු කරන ලද වාර්ෂික නඩු

පළාත	දිස්ත්‍රික්කය	ජන	පෙබ	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝ	සැප්	ඔක්	නොවැ	දෙසැ	මුළු
		නඩු	නඩු	නඩු	නඩු	නඩු	නඩු	නඩු	නඩු	නඩු	නඩු	නඩු	නඩු	
බටහිර	කොළඹ	7	50	62	47	29	37	57	169	76	157	127	102	920
	ප්‍රධාන කාර්යාලය	-	-	-	22	76	-	16	17	42	23	9	6	211
	ප්‍රධාන කාර්යාලය	-	1	5	27	8	15	6	11	-	-	-	-	73
	ගම්පහ	152	116	151	134	148	146	72	0	38	98	89	25	1,169
	කළුතර	52	48	36	27	56	55	99	37	56	100	63	38	667
දකුණු	ගාල්ල	45	42	72	47	84	97	95	54	69	69	81	46	801
	මාතර	69	85	95	44	135	96	131	72	115	66	104	59	1,071
	හම්බන්තොට	48	82	28	40	17	39	36	39	39	70	64	21	523
සබරගමුව	රත්නපුරය	90	77	54	51	97	70	71	79	94	61	82	47	873
	කෑගල්ල	83	89	82	2	183	103	215	128	133	127	158	43	1,346
මධ්‍යම	මහනුවර	123	99	145	68	134	131	219	88	161	175	179	65	1,587
	මාතලේ	47	92	47	70	52	69	48	60	102	11	54	37	689
	නුවරඑළිය	40	65	66	23	83	58	69	33	74	70	80	36	697
උතුරු මැද	අනුරාධපුර	96	77	99	77	127	120	167	137	119	138	163	112	1,432
	පොලොන්නරුව	91	54	48	11	105	70	66	55	42	48	65	28	683
උතුරු	යාපනය	41	56	43	10	85	65	99	53	54	102	111	110	829
	වවුනියාව	11	11	0	28	24	81	65	33	110	88	80	50	581
	මුලතිව්	29	39	29	40	52	53	50	24	46	35	67	63	527
	මන්නාරම	65	53	42	18	49	37	53	45	54	54	55	24	549
	කිලිනොච්චිය	41	50	16	14	59	40	46	41	41	32	42	12	434
ඌව	බදුල්ල	95	47	52	24	75	51	58	21	68	53	24	10	578
	මොනරාගල	51	17	47	33	54	87	57	35	63	41	60	27	572
නැගෙනහිර	ත්‍රිකුණාමලය	84	43	75	22	103	65	95	72	81	77	76	49	842
	අම්පාර	118	75	74	64	91	88	112	67	114	113	112	48	1,076
	මඩකලපුව	63	70	21	68	89	79	98	95	85	89	101	53	911
වයඹ	කුරුණෑගල	103	39	134	84	164	180	216	213	253	234	201	126	1,947
	පුත්තලම	73	98	76	31	140	102	185	150	174	106	139	51	1,325
මුළු එකතුව		1,717	1,575	1,599	1,126	2,319	2,034	2,501	1,828	2,303	2,237	2,386	1,288	22,913


දිස්ත්‍රික් අනුව පනවන ලද දඩ මුදල්වල මාසික සාරාංශය

පළාත	දිස්ත්‍රික්කය	ජන	පෙබ	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝ	සැප්	ඔක්	නොවැ	දෙසැ	මුළු
		දඩ (රු.මිලි)	දඩ (රු.මිලි)	දඩ (රු.මිලි)	දඩ (රු.මිලි)	දඩ (රු.මිලි)	දඩ (රු.මිලි)	දඩ (රු.මිලි)	දඩ (රු.මිලි)	දඩ (රු.මිලි)	දඩ (රු.මිලි)	දඩ (රු.මිලි)	දඩ (රු.මිලි)	
බටහිර	කොළඹ	2.109	2.005	10.744	3.533	3.171	1.751	4.870	1.437	2.059	2.018	3.512	1.894	39.102
	ප්‍රධාන කාර්යාලය	-	-	-	1.910	1.067	-	0.080	0.159	0.924	0.882	0.060	0.140	5.222
	ප්‍රධාන කාර්යාලය	-	0.010	0.040	2.814	2.205	1.027	0.153	0.137	0.110	0.050	0.008	0.005	6.558
	ගම්පහ	2.007	1.019	2.060	4.928	3.516	2.660	1.057	-	0.321	1.638	1.822	0.249	21.276
	කළුතර	0.629	0.918	0.247	0.463	1.377	1.246	0.801	0.717	0.791	1.181	1.475	0.396	10.239
දකුණු	ගාල්ල	0.329	0.445	0.897	0.921	1.500	1.390	1.131	0.401	0.942	0.533	1.104	0.500	10.093
	මාතර	0.500	0.556	0.860	1.281	1.403	1.569	1.779	0.423	1.380	0.704	1.037	0.396	11.887
	හම්බන්තොට	0.131	0.366	0.350	0.741	0.157	0.547	0.635	0.389	0.652	0.961	0.643	0.087	5.654
සබරගමුව	රත්නපුරය	0.990	0.566	0.486	0.447	1.443	1.161	1.372	0.741	1.284	0.708	2.965	0.755	12.914
	කෑගල්ල	0.552	0.645	1.135	0.024	1.155	0.665	1.355	0.913	0.950	0.669	1.207	0.260	9.528
මධ්‍යම	මහනුවර	0.414	0.271	0.251	0.524	0.318	0.336	0.468	0.172	0.451	0.552	1.186	0.148	5.089
	මාතලේ	0.282	0.499	0.553	0.697	0.312	0.471	0.515	0.371	0.341	0.266	0.272	0.145	4.724
	නුවරඑළිය	0.174	0.198	1.030	0.956	2.058	1.485	1.718	0.706	0.989	1.198	2.764	0.425	13.701
උතුරු මැද	අනුරාධපුර	0.733	0.679	0.798	0.634	1.741	2.122	3.440	1.598	2.881	1.559	2.443	1.213	19.839
	පොලොන්නරුව	0.950	0.619	0.596	0.085	0.563	0.884	0.481	0.389	0.135	0.219	0.742	0.149	5.812
උතුරු	යාපනය	0.499	0.244	0.980	1.060	1.291	0.655	1.246	0.337	0.870	1.474	0.812	0.910	10.376
	වවුනියාව	0.026	0.098	0.040	0.109	0.225	0.231	0.239	0.237	0.247	0.238	0.277	0.354	2.320
	මුලතිව්	0.113	0.163	0.127	0.176	0.227	0.252	0.245	0.207	0.296	0.175	0.235	0.086	2.302
	මන්නාරම	0.106	0.197	0.219	0.129	0.291	0.536	0.276	0.286	0.304	0.366	0.340	0.257	3.307
	කිලිනොච්චිය	0.301	0.305	0.078	0.342	0.281	0.394	0.531	0.379	0.701	0.240	0.291	0.041	3.884
ඌව	බදුල්ල	1.197	0.273	0.493	0.333	0.971	0.458	0.308	0.175	0.411	0.349	1.076	0.145	6.187
	මොනරාගල	0.643	0.265	0.266	0.152	0.330	0.572	0.354	0.174	0.417	0.432	0.516	0.221	4.339
නැගෙනහිර	ත්‍රිකුණාමලය	0.368	0.414	0.455	0.479	0.492	0.791	0.542	0.457	0.427	0.716	0.573	0.383	6.095
	අම්පාර	0.349	0.411	0.338	0.193	0.464	0.392	1.262	0.482	0.685	0.686	1.189	0.155	6.603
	මඩකලපුව	0.441	0.617	0.387	0.789	0.907	2.237	1.467	1.000	1.129	0.734	3.053	0.327	13.086
වයඹ	කුරුණෑගල	0.713	0.342	1.175	1.715	1.647	1.743	2.469	2.187	2.115	2.327	3.823	1.273	21.527
	පුත්තලම	0.380	0.642	0.854	0.321	1.411	0.969	1.713	1.053	1.368	0.735	1.681	0.370	11.496
මුළු		14.931	12.764	25.456	25.752	30.519	26.542	30.504	15.522	23.176	21.607	35.103	11.279	273.153

අධිකාරිය විසින් සිදු කරන ලද මාසික වැටලීම්



අධිකරණය විසින් නියම කරන ලද දඩ මුදල්



කූඨ වෙළෙන්දන්ට එරෙහිව අදාළ මහේස්ත්‍රාත් අධිකරණවල නඩු පවරනු ලබන අතර, පනතේ 60 වැනි වගන්තියේ දී ලබා දී ඇති විධිවිධාන මත පදනම්ව දඩ නියම කරනු ලැබේ. අධිකාරිය මගින් එකතු කරන දඩ මුදල් රජයට ආදායම් මාර්ගයකි. 2023 වසරේ මහේස්ත්‍රාත් අධිකරණය විසින් නියම කරන ලද දඩ මුදල් ප්‍රමාණය ඉහත වගුවේ දක්වා ඇත. එම කාල සීමාව තුළ සිදු කළ වැටලීම් සහ ගොනු කරන ලද නඩු සඳහා උසාවි මගින් පනවන ලද දඩ මුදල්වල පැහැදිළි අස්ථාවරත්වයක් දක්නට ඇත.

4.2.4 භාණ්ඩවල ගුණාත්මකභාවය සම්බන්ධයෙන් සිදුකරන ලද රසායනාගාර පරීක්ෂාවන්

භාණ්ඩ වර්ගය	පරීක්ෂා කරන ලද භාණ්ඩ සංඛ්‍යාව	අදාළ පරීක්ෂණ අවශ්‍යතාවලට අනුකූල වීම	අදාළ පරීක්ෂණ අවශ්‍යතාවලට අනුකූල නොවන	ලැබීමට ඇති පරීක්ෂණ වාර්තා
මත්පැන්	1		1	
බෝතල් කළ පානීය ජලය	2	2		
දුඹුරු සීනි	5	5		
බිස්කට්	1	1		
ටින් මාළු	3	3		
ආලේපිත තහඩු	3		3	
පොල් තෙල්	1		1	
ක්‍රීම්	22	11	11	
රට ඉදි	1	1		
ඩීසල්	1	1		
බිත්තර	11	11		
ෆේස් වොශ්	3	2	1	
පොහොර	1	1		
වියළි මිරිස්	3	3		
හිසකෙස් වර්ණ ගන්වන ඩයි	3		3	
මදුරු දඟර	1			1
ලෝෂන්	7	5	2	
සහල්	27	21	6	
තේ	2	2		
කලිසම්	1	1		
රතු වයින්	1	1		
ගිනිපෙට්ටි	3	1	2	
වානේ බාර්	18	9	9	
අළුහුණු	5	5		
සව්	1	1		
පපඩම්	1	1		
තීන්ත	1	1		
සුදුළූණු	1	1		
තිරිඟු පිටි	3	3		
පරීක්ෂා කරන ලද නියැදි එකතුව	**133**	**93**	**39**	**1**

01. තරඟ විරෝධී භාවිතයන් පිළිබඳ විමර්ශන සිදු කිරීමට අධිකාරියට 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු අධිකාරී පනතේ 34 වැනි වගන්තියට අනුව බලය පවතී.

ක්‍රියාකාරකම්	2023
අදාළ කාල සීමාව තුළ ලද පැමිණිලි	50
අදාළ කාල සීමාව තුළ විසඳා ඇති පැමිණිලි	27
සභාව වෙත යොමු කරන ලද පැමිණිලි	0
පැමිණිලි යටතේ ලබා ඇති ප්‍රගතිය	23

02. වෙළෙඳ අධිකාරය අනිසි ලෙස භාවිතා කිරීම සහ ඕනෑම තරඟකාරී විරෝධී භාවිතයන් පැතිරීම හඳුනා ගැනීම සඳහා ජංගම විමර්ශන පැවැත්වීම.

ක්‍රියාකාරකම්	2023
සිදු කරන ලද විමර්ශන	2

03. 87 විධානයට අනුව, වෙළඳපොලේ ඇති බිස්කට්, කේක්, රසකැවිලි (චුවින්ගම් සහිත), සබන් සහ චොකලට් වල ප්‍රකාශිත/සහතික කළ උ.සි. මි. නිරීක්ෂණය කිරීම .

ක්‍රියාකාරකම්	2023
ක්‍රියාවට නංවන ලද අයදුම්පත් ගණන	107

04. වෙළෙඳපොළ බුද්ධි තොරතුරු රැස් කිරීම.

ක්‍රියාකාරකම්	2023
වෙළෙඳපොළ බුද්ධි සමීක්ෂණ පවත්වා ඉදිරිපත් කරන ලද වාර්තා	8

සටහන:
ඉන්ධන ආකලන, පරිප්පු (සමීක්ෂණ 2ක්), කාබනික නිෂ්පාදන, මිරිස් කුඩු (මීල, ගුණාත්මකභාවය), හඳුන්කුරු, පාන් පිළිබඳ සමීක්ෂණය කිරීම.

05. වෙළෙඳපොළ තත්ත්වය අවබෝධ කර ගැනීම සඳහා අධ්‍යයනයන් පැවැත්වීම

ක්‍රියාකාරකම්	2023
සම්පූර්ණ කළ අධ්‍යයන සංඛ්‍යාව	3
සිදුවෙමින් පවතින අධ්‍යයන සංඛ්‍යාව	2

සටහන:
සම්පූර්ණ කරන ලද අධ්‍යයන - මිරිස් කුඩු පිළිබඳ අධ්‍යයන, කිරි සම්බා පිළිබඳ අධ්‍යයන, සීනි පිළිබඳ අධ්‍යයන සිදු කෙරෙමින් ඇති ප්‍රගති අධ්‍යයන- කුඩා ළමුන්ගේ ඩයපර්ස් පිළිබඳ අධ්‍යන සහ විලවුන් පිළිබඳ අධ්‍යයන.

06. ජාතික ව්‍යාපාර නාමාවලියක් සකස් කර සංවර්ධනය කිරීම, නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම

2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 27 වැනි වගන්තියට අනුව සෑම වෙළෙන්දෙක්ම අධිකාරියේ ලියාපදිංචි විය යුතුය.

<u>ක්‍රියාකාරකම්</u>

යෝග්‍ය පද්ධතිය ලබා ගැනීම සඳහා පද්ධති සේවා සපයන්නන් සමඟ සාකච්ඡා කර දැනට ප්‍රසම්පාදන ක්‍රියාවලියක් ආරම්භ කර ඇති අතර සේවා සපයන්නෙකු තෝරා ගැනීම සඳහා ලංසු විවෘත කිරීම අවසන් කර ඇත.

07. ආහාර සහ සෞඛ්‍ය සම්බන්ධ පාරිභෝගික භාණ්ඩ ප්‍රමිතිකරණය අනිවාර්ය කිරීම.

<u>ක්‍රියාකාරකම්</u>	<u>2023</u>
නියැදි පරීක්ෂාව	12

සටහන: පරිප්පු, ශරීර ආලේපන, ඔලිව් තෙල්, මිරිස් කුඩු, තිරිඟු පිටි, සහල්, ටින් මාළු, තල තෙල්, මී පැණි සහ ගිතෙල්

08. තරඟකාරිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා වෙළඳුන් සඳහා උපදේශන වැඩසටහන් පැවැත්වීම

2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ කාර්යයන්ට අනුව භාණ්ඩ හා සේවා සපයන පුද්ගලයින් අතර ඵලදායී තරඟකාරිත්වය පවත්වා ගැනීම සහ ප්‍රවර්ධනය කිරීම.

<u>ක්‍රියාකාරකම්</u>	<u>2023</u>
පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	05

සටහන: *Laughs ,කාගිල්ස් (සැසි) , කිල්ස් ,විලවුන් ආනයනකරුවන් සඳහා*

09. වෙළඳපොලේ දී 87 විධානය යටතේ ප්‍රකාශිත/සහතික කළ ආනයනික උපරිම සිල්ලර මිල නිරීක්ෂණය කිරීම.

<u>ක්‍රියාකාරකම්</u>	<u>2023</u>
හඳුනාගත් නිෂ්පාදන සංඛ්‍යාව නිරීක්ෂණය	09

සටහන: ලොලිපොප්, බබල්ගම්, බිස්කට්, චොකලට්

4.3 අසාධාරණ වෙළෙඳ පිළිවෙත් මඟින් අගතියට පත් පාරිභෝගිකයන්ට සහන ලබාදීම

4.3.1 පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම.

පනතේ 13 සහ 32 වගන්තිවල ලබා දී ඇති විධිවිධාන මත පදනම්ව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පාරිභෝගික පැමිණිලිවලට මැදිහත් වේ. නිෂ්පාදකයා හෝ වෙළෙන්දා විසින් ඇණවුම් කර හෝ වෙනත් ආකාරයකින් ලබා දී ඇති වගකීම් සහතිකයට අනුකූල නොවන භාණ්ඩ විකිණීම සහ සේවා සැපයීම පිළිබඳ පැමිණිලි සම්බන්ධයෙන් අධිකාරියට විමසීම් කළ හැකිය.

පාරිභෝගික පැමිණිලි අංශයට ලද පැමිණිලි

විස්තරය	සංඛ්‍යාව
ලද පාරිභෝගික පැමිණිලි සංඛ්‍යාව	1132
අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව	
වෙනත් ආයතනවලට යොමු කළ	253
1977 න් වැටලීම් අංශයට යොමු කළ	70
දිස්ත්‍රික් කාර්යාල වලට යොමු කළ	49
වෙනත් අංශවලට යොමු කළ	5
අවසන් කළ වෙනත් පැමිණිලි	342
අවසන් කරන ලද මුළු පැමිණිලි සංඛ්‍යාව	719
විධිමත් පරීක්ෂණ සඳහා යොමු කළ පැමිණිලි	129
දෙපාර්ශවයේ එකඟතාවය මත විසඳන ලද පැමිණිලි	284

පාරිභෝගික පැමිණිලි පිළිබඳ විමර්ශන

ක්‍රියාකාරීත්වය	කාර්ය සාධනය
පරීක්ෂණ සඳහා ලැබී ඇති නව පැමිණිලි	303
13 සහ 32 වගන්ති මත සිදු කරන ලද පාරිභෝගික පැමිණිලි පිළිබඳ විමර්ශන	877
විමර්ශන මඟින් විසඳන ලද පැමිණිලි	156
නිකුත් කරන ලද නියෝග- පනතේ 13(4), 32(5) වගන්තිය	92
අධිකරණ නඩු- නියෝග බලාත්මක කිරීම-13(6) සහ 32(7)	8
අධිකාරිය පනතේ 11,30,31,57 වගන්ති	110
නඩු විභාග ඇතුළුව අධිකරණයේ පෙනී සිටීම	394
2023 දී අධිකාරියට එරෙහිව පවරා ඇති අධිකරණ නඩු	9
නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇති නිරීක්ෂණ වාර්තා	9
සහභාගී වූ උපදේශන	32
අධිකරණය විසින් පනවන ලද දඩ මුදල් ප්‍රමාණය (රු.)	1,137,000


පාරිභෝගික පැමිණිලි

	ලැබී ඇති සම්පූර්ණ පැමිණිලි	සාකච්ඡා කිරීමෙන් පසු විසඳුන ලද	නීති සහ බලාත්මක කිරීම වෙත යොමු කරන ලද	ශේෂ පැමිණිලි	සම්පූර්ණයෙන් විසඳුන ලද	නිම කල
පාරිභෝගික පැමිණිලි අංශය	1132	284	129	0	1132	100
ගම්පහ	20	9	3	0	16	80
කළුතර	30	7	7	5	23	77
ගාල්ල	59	30	8	15	44	75
මාතර	23	20	1	2	23	100
හම්බන්තොට	18	3	2	5	6	33
රත්නපුරය	6	1	0	0	3	50
කෑගල්ල	25	9	0	5	12	48
පුත්තලම	8	3	0	0	8	100
කුරුණෑගල	12	6	0	0	7	58
මහනුවර	72	31	0	0	54	75
නුවරඑළිය	7	1	0	0	1	14
මාතලේ	38	6	0	0	20	53
බදුල්ල	20	0	2	4	15	75
මොනරාගල	2	0	0	0	2	100
අම්පාර	13	7	0	0	7	54
මඩකලපුව	6	3	0	0	6	100
ත්‍රිකුණාමලය	0	0	0	0	0	0
අනුරාධපුර	91	45	0	0	65	71
පොලොන්නරුව	36	0	0	0	20	56
යාපනය	9	0	0	0	9	100
මන්නාරම	9	0	0	0	0	0
වවුනියාව	0	0	0	0	0	0
කිලිනොච්චිය	35	1	0	0	34	97
මුලතිව්	3	3	0	0	3	100
මුළු එකතුව	**1674**	**466**	**152**	**36**	**1510**	**90**

1977 ක්ෂණික ඇමතුම් අංකයට ලද පැමිණිලි

දිස්ත්‍රික්කය	ලද පැමිණිලි	සාර්ථක බැටලීම්	අසාර්ථක බැටලීම්	වසා දැමූ ඡේධ	අධිකාරියට අදාළ නොවන	උපදෙස් ලබා දුන්	හඳුනා ගත නොහැකි	ශේෂය
කොළඹ	1658	375	205	21	2	10	33	1012
ගම්පහ	997	62	1	4	11	86	5	828
හම්බන්තොට	175	59	62	3	0	8	10	33
කළුතර	536	120	82	13	155	40	30	96
ගාල්ල	507	85	100	27	14	79	16	186
මාතර	368	124	0	3	1	170	12	58
රත්නපුරය	314	54	21	2	47	23	10	157
කෑගල්ල	256	75	14	12	26	42	2	85
මහනුවර	293	88	65	14	1	2	3	120
මාතලේ	147	50	12	9	5	21	7	43
අනුරාධපුර	230	100	14	5	0	33	8	70
නුවරඑළිය	165	56	33	4	1	10	3	58
මුලතිව්	6	0	0	1	0	5	0	0
පොලොන්නරුව	130	50	59	6	2	0	4	9
කිලිනොච්චිය	11	5	1	0	0	3	2	0
වවුනියාව	11	8	2	0	0	0	1	0
යාපනය	47	25	0	1	0	21	0	0
මන්නාරම	32	22	3	2	0	1	4	0
මොනරාගල	151	70	30	12	2	28	7	2
ත්‍රිකුණාමලය	71	44	3	3	0	15	3	3
බදුල්ල	159	22	2	0	4	130	0	1
මඩකලපුව	43	27	7	2	0	5	2	0
අම්පාර	149	78	29	9	4	10	8	11
කුරුණෑගල	570	210	222	4	0	7	21	106
පුත්තලම	236	114	80	1	0	28	6	7
මුළු එකතුව	**7262**	**1923**	**1047**	**158**	**275**	**777**	**197**	**2885**

1977 ක්ෂණික ඇමතුම් අංකයට ලද පැමිණිලි සාරාංශය



4.4 සාධාරණ මිල සහතික කිරීම

4.4.1 නිශ්චිත භාණ්ඩවල මිල නියාමනය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 14, 18 සහ 19. යන විධිවිධාන යටතේ තෝරා ගත් අත්‍යවශ්‍ය භාණ්ඩ හරහා වෙළෙදාම පහසු කිරීම සඳහා අධිකාරියේ මිල සහ කළමනාකරණ අංශය මැදිහත් වේ. කෙසේ වෙතත්, මෑතකදී ඉහත වගන්ති බලාත්මක කිරීම තුළින් සෘණාත්මක ප්‍රතිවිපාක ඇතිකර තිබේ. වත්මන් ආර්ථික වාතාවරණය තුළ මිල පාලනය බොහෝ විට සරල විසඳුමක් ලෙස පෙනුනද එය සෘණාත්මක ආර්ථික ප්‍රතිවිපාක ඇති කරන බව පෙනේ. කොවිඩ් වසංගතය ආරම්භයට පෙර පාරිභෝගික කටයුතු අධිකාරිය භාණ්ඩ හා සේවා සඳහා උපරිම හෝ අවම මිලක් නියම කරන ලද නමුත් එම තීරණය වර්තමානයේදී අනපේක්ෂිත ප්‍රතිවිපාක ඇති කර ඇත. ඒවා නම් වෙළඳපොළ තුළ භාණ්ඩ හිඟකම, කළුකඩ ව්‍යාපාර බිහිවීම සහ ජාවාරම්, අකාර්යක්ෂමතාවයන් සහ නිෂ්පාදනවල ගුණාත්මකභාවයට අඩුවීම, ඉහළ මිල ගණන් සහිත වෙළෙඳපොළවල් බිහිවීම, අවිධිමත් අංශවල කටයුතු ඔස්සේ කතිපයාධිකාරී සහ ඒකාධිකාරී වෙළෙඳපොළ තත්වයන් බිහිවීමට පසුබිම සැකසීම ආදියයි. එබැවින් අධිකාරිය වක්‍රාකාර ක්‍රමවේද ඔස්සේ වෙළඳපොළට මැදිහත් වීම පහත පරිදි වේ.

- අධිකාරිය **පනතේ 14 සහ 18 වගන්ති මඟින් වෙළෙඳාමට පහසුකම් සැලසීම.**
  2283/43 දරන නියෝගය යටතේ තිරිඟු පිටි අත්‍යවශ්‍ය භාණ්ඩයක් ලෙස නියම කර ඇත. ප්‍රීමා සහ සෙරන්ඩිබ් යන සමාගම් දෙකේ මිල විචලනයන් නිරීක්ෂණය කිරීමට යාන්ත්‍රණයක් ස්ථාපිත කර ඇත. LPG (ද්‍රව පෙට්‍රෝලියම් වායුව) 2023.06.16 දින අංක 2336/67 නියෝගයෙන් අත්‍යවශ්‍ය භාණ්ඩවලින් ඉවත් කරන ලදී.
- **19 වගන්තිය මඟින් වෙළඳාමට පහසුකම් සැලසීම:**
  වෙළෙඳපොළේ (සාමාන්‍ය හා සුපිරි වෙළෙඳසැල්) හඳුනාගත් අධික ආන්තිකයක් සහිත බිත්තර, සම්පූර්ණ යොදය සහිත කිරිපිටි, නැවුම් කිරි, තිරිඟු පිටි, වතුර බෝතල්, කුකුල් මස් සහ අනෙකුත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ආදිය පිළිබඳව අධ්‍යයන් සිදු කර ඒ සඳහා වෙළෙඳපොළේ පවතින අධික ආන්තිකය,

පාරිභෝගික කටයුතු පිළිබඳ කවුන්සිලයට මිල සූත්‍රයක් හෝ වෙනත් අධීක්ෂණ යාන්ත්‍රණයක් පැන විය යුතුද යන්න විමර්ශනය කිරීමට හා වාර්තා කිරීමට යොමු කර ඇත.

ඉහත අධීක්ෂණ ක්‍රමවේදයන්ට අමතරව පහත සඳහන් නිෂ්පාදන සඳහා පිරිවැය සත්‍යාපනය කර ඇති අතර අධිකාරියේ මිල තීරණය කිරීමේ කමිටුව වෙත නිර්දේශ ලබා දී ඇත. මෙම අධ්‍යයනයන් මත පදනම්ව ගැසට් නිවේදන බලාත්මක කිරීමකින් තොරව ඇතැම් භාණ්ඩවල මිල, සමාගම් විසින් වරින් වර අඩු කරනු ලැබ ඇත.

භාණ්ඩය	ප්‍රතිඵලය
1. සිමෙන්ති	50kg බෑගයක් රු.3200/= සිට රු. 1950/= දක්වා
2. යකඩ කම්බි	මෙට්රික් ටොන් එකක් රු.245,000/= සිට රු. 130,000/= දක්වා.
3. කේබල් සහ වයර්	ඇතැම් සමාගම් වයර් වර්ග, මිල අඩු කිරීමට ඉදිරිපත් වී ඇත
4. සපත්තු	10% සිට 15% දක්වා මිල අඩු කර ඇත.
5. ඇලුමිනියම්	ආන්තිකය පාලනය කිරීම අවශ්‍යව ඇත.
6. කුකුල් මස්	1kg රු. 1,350 සිට රු. 1,100/= දක්වා
7. පාන්	රු. 170/= සිට රු. 150/= දක්වා
8. ලුණු	ආන්තිකය පාලනය කිරීම අවශ්‍යව ඇත.
9. තිරිඟු පිටි	වරින් වර මිල අඩු කිරීම් සිදු කර ඇත වර්තමාන කර්මාන්තශාලා පිටවුම් මිල රු.195 /= සිට 184 /= දක්වා
10. කුළුබඩු (මිරිස් කුඩු)	කුළුබඩු නිෂ්පාදකයන් ඒවායෙහි මිල තීරණය කිරීමේදී මිරිස් කුඩු වලින් අලාභ ලබමින් අනෙකුත් කුළුබඩු වර්ග ලාභ සහිතව වෙළෙඳාම් කරයි. පරිමාණය සහ ගුණාත්මකභාවය මත පදනම්ව මිල වෙනස්වීම පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.
11. තිරිඟු පිටි, මුං ඇට , උදු සහ බඩ ඉරිඟු	ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා වෙළෙඳ සහ ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.
12. දේශීය කිරිපිටි, දේශීය සීනි සහ පොහොර	නිෂ්පාදන කාර්යක්ෂමතාව වැඩිදියුණු කළ යුතු අතර දේශීය කිරිපිටි මිල කුඩා ප්‍රතිශතයකින් මිල අඩු කර ඇත.

13. මේද රහිත කිරි, සබන්, ටින්මාළු සහ කුළුබඩු (තුනපහ සහ කහ)	මිල අඩු කිරීමේ හැකියාව සලකා බලන ලෙස ඉල්ලා ඇත.
14. අභ්‍යාස පොත්	අධිකාරියේ නිර්දේශ ජනාධිපති ලේකම් කාර්යාලයට ලබාදී ඇත.
15. දිනක් වයසැති කුකුල් පැටවුන්ගේ පිරිවැය ව්‍යුහය	වෙළෙඳපොළ යාන්ත්‍රණය අනුව මිල තීරණය වීමට ඉඩ දී ඇත
16. සම්පූර්ණ යොදය සහිත කිරිපිටි, තිරිඟු පිටි, සීනි, වියළි හාල්මැස්සන්, පරිප්පු වැනි අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මිල ගණන්	පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කර ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශය වෙත තොරතුරු ඉදිරිපත් කර ඇත.

- අමාත්‍යාංශය **සහ පාර්ශවකරුවන් වෙත තොරතුරු බෙදා හැරීම තුළින් වෙළඳාමට පහසුකම් සැලසීම.**

අනු/අංක	විස්තරය
01	දෛනික මිල එකතු කිරීමේ වාර්තා
02	සිල්ලර මිල විචලනයන්
03	අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයන වාර්තා
04	භාණ්ඩවල සුලභතාවය පිළිබඳ සමීක්ෂණ වාර්තා - නිෂ්පාදන හා පුරෝකතන
05	සීනි තොග වාර්තා
06	වෙළෙඳපොළ සමීක්ෂණ පැවැත්වීම සහ තොරතුරු බෙදා හැරීම
07	තොග ගබඩා ලියාපදිංචිය යටතේ ලැබුණු අයදුම්පත් යාවත්කාලීන කිරීම සහ ඉල්ලීම් මත බැංකු තහවුරු ලිපි ලබාදීම.
08	අධිකරණ කටයුතුවලට අදාළ තොරතුරු ඉදිරිපත් කිරීම

4.5 ආයතනයේ ධාරිතාව වැඩි දියුණු කිරීම

4.5.1 අධිකාරියේ කාර්ය මණ්ඩලය

වත්මන් සංවිධාන ව්‍යුහය අනුව අධ්‍යක්ෂ ජනරාල්වරයා අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස කටයුතු කරන අතර , අධිකාරියේ සභාපති සහ පූර්ණ කාලීන සාමාජිකයින් තිදෙනෙකු ඇතුළු සාමාජිකයින් විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතුවේ. අධිකාරියේ සමස්ත මෙහෙයුම් කටයුතු භාරවන්නේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට වන අතර ඔහු යටතේ අංශ හයක අධ්‍යක්ෂවරුන් ආයතනයේ අරමුණු ලහාකර ගැනීම සඳහා වගකීම් දරයි.

එම අංශ පහත පරිදි වේ.

- පාරිභෝගික කටයුතු සහ තොරතුරු අංශය,
- තරඟකාරීත්ව ප්‍රවර්ධන අංශය,
- මිල සහ කළමනාකරණ අංශය,
- නීති හා බලගැන්වීම් අංශය,
- මූල්‍ය අංශය,
- මානව සම්පත් හා පරිපාලන අංශය.

අධිකාරියේ කාර්ය මණ්ඩලය පහත කණ්ඩායම් වලින් සැකසී ඇත.

- අන්තර්ග්‍රහණය කරන ලද අධිකාරියේ සේවය කිරීමට පනතේ විධිවිධාන අනුව තෝරා ගන්නා ලද සාධාරණ වෙළෙඳ කොමිසමේ සේවකයින්,
- ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කළ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම සම්බන්ධ අයදුම්පතක් මත ලබාදුන් සමථ කොන්දේසියට යටත්ව අභ්‍යන්තර වෙළෙඳ දෙපාර්තමේන්තුවෙන් අන්තර්ග්‍රහණය කරන ලද සේවකයින්.
- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට වරින් වර බඳවා ගන්නා ලද සේවකයින්.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මුහුණ දී ඇති එක් තීරණාත්මක අභියෝගයක් වන්නේ අනුමත සේවක සංඛ්‍යාවේ පවතින විශාල පුරප්පාඩු ප්‍රමාණයයි. විශේෂයෙන්ම පළාත් මට්ටමින් අධිකාරියේ ඉලක්ක සපුරා ගැනීමට මෙය බලපා ඇත. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් පුරප්පාඩු තනතුරු සඳහා අවශ්‍ය නිලධාරීන් බඳවා ගැනීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇති අතර, පුරප්පාඩු තනතුරු සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් සිටී.

2023.12.31 දිනට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්ය මණ්ඩල තොරතුරු

තනතුරු	වැටුප් කේතය	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව		පුරප්පාඩු	සැබෑ සේවක සංඛ්‍යාව
			ස්ථිර	තාවකාලික / කොන්ත්‍රාත් / වැඩ බලන		
ජ්‍යෙෂ්ඨ **කළමනාකරු**		**8**	**6**	**2**	**2**	**8**
අධ්‍යක්ෂ ජනරාල්	**HM 2-1**	**1**	**0**	**1**	**1**	**1**
අධ්‍යක්ෂ (නීති සහ බලගැන්වීම්)	**HM 1-1**	**1**	**1**		**0**	**1**
අධ්‍යක්ෂ (පරිපාලන සහ මානව සම්පත්)		**1**	**1**		**0**	**1**
අධ්‍යක්ෂ (මුදල්)		**1**	**1**		**0**	**1**
අධ්‍යක්ෂ (තරඟකාරීත්ව ප්‍රවර්ධන)		**1**	**1**		**0**	**1**
අධ්‍යක්ෂ(මිල හා කළමනාකරණ)		**1**	**1**		**0**	**1**
අධ්‍යක්ෂ (පාරිභෝගික කටයුතු හා තොරතුරු)		**1**	**1**		**0**	**1**
පාරිභෝගික සභාවේ ලේකම්		**1**		**1**	**1**	**1**
කළමනාකරු		**26**	**11**	**0**	**15**	**10**
අභ්‍යන්තර විගණක	**MM 1-1**	**1**	**1**	**0**	**0**	**0**
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (නීති හා බලගැන්වීම්)		**2**	**2**	**0**	**0**	**2**
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන සහ මානව සම්පත්)		**2**	**1**	**0**	**1**	**1**
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)		**2**	**2**	**0**	**0**	**2**
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (තරඟකාරීත්ව ප්‍රවර්ධන)		**2**	**1**	**0**	**1**	**1**
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (මිලකරණය සහ කළමනාකරණ)		**2**	**0**	**0**	**2**	**0**
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාරිභෝගික කටයුතු හා තොරතුරු)		**2**	**0**	**0**	**2**	**0**
නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් / සහකාර අධ්‍යක්ෂ ප්‍රාදේශීය කටයුතු.		**12**	**4**	**0**	**8**	**4**
නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (සන්නිවේදන)- කොන්ත්‍රාත් පදනම		**1**	**0**	**0**	**1**	**0**
කනිෂ්ඨ කළමනාකරු		**46**	**40**	**0**	**8**	**37**
විගණන නිලධාරී	**JM 1-1**	**2**	**1**	**0**	**1**	**1**
පද්ධති පරිපාලක		**1**	**1**	**0**	**0**	**1**
ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී		**27**	**29**	**0**	**0**	**26**
ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාන නිලධාරී		**1**	**0**	**0**	**1**	**0**
ජ්‍යෙෂ්ඨ වෙළඳපල පර්යේෂණ විශ්ලේෂක		**1**	**0**	**0**	**1**	**0**
ජ්‍යෙෂ්ඨ ගිණුම් නිලධාරී		**2**	**1**	**0**	**1**	**1**
රහස්‍ය ලේකම් (සභාපති)		**1**	**1**	**0**	**0**	**1**
රහස්‍ය ලේකම් (අධ්‍යක්ෂ ජනරාල්)		**1**	**0**	**0**	**1**	**0**

ජ්‍යෙෂ්ඨ පරිපාලන/ මානව සම්පත් නිලධාරි		**1**	**0**	**0**	**1**	**0**
නීති සහ බලගැන්වීම් නිලධාරි/ ජ්‍යෙෂ්ඨ නීති සහ බලගැන්වීම් නිලධාරි		**8**	**6**	**0**	**2**	**6**
ජ්‍යෙෂ්ඨ පිරිවැය නිලධාරි		**1**	**1**	**0**	**0**	**1**
බලගැන්වීම්/මෙහෙයුම්/ව්‍යාප්ත කිරීම්		**481**	**353**	**1**	**127**	**333**
දත්ත සම්බන්ධීකාරක	**MA 5-2**	**1**	**0**	**0**	**1**	**0**
සංඛ්‍යාලේඛන නිලධාරි		**1**	**1**	**0**	**0**	**1**
වෙළඳපල පර්යේෂණ විශ්ලේෂක		**1**	**0**	**0**	**1**	**0**
ලේඛන නිලධාරි II		**6**	**1**	**0**	**5**	**1**
පුස්තකාලයාධිපති		**1**	**1**	**0**	**0**	**1**
පිරිවැය නිලධාරි		**15**	**1**	**0**	**12**	**1**
ගිණුම් නිලධාරි			**2**	**0**		**2**
පරිපාලන නිලධාරි II		**5**	**1**	**0**	**4**	**1**
විමර්ශන නිලධාරීන්		**450**	**346**	**0**	**104**	**325**
මාධ්‍ය නිලධාරි (කොන්ත්‍රාත් පදනම)		**1**	**0**	**1**	**0**	**1**
කළමනාකරණ සහකාර (තාක්ෂණ)		**2**	**0**	**1**	**1**	**1**
පොත් තබන්නා	**MA 2-2**	**1**	**0**	**0**	**1**	**0**
කැමරාකරු (කොන්ත්‍රාත් පදනම)		**1**	**0**	**1**	**0**	**1**
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)		**51**	**37**	**0**	**14**	**36**
කළමනාකරණ සහකාර	**MA 1-2**	**50**	**37**	**0**	**14**	**36**
කළමනාකරණ සහකාර (Shroff)		**1**	**0**			**0**
ප්‍රාථමික මට්ටම (පුහුණු)		**28**	**21**	**0**	**6**	**20**
රියදුරු	**PL 3**	**28**	**21**	**0**	**7**	**20**
ප්‍රාථමික මට්ටම (නුපුහුණු)		**25**	**21**	**1**	**3**	**21**
කාර්යාල සහායක	**PL 1**	**24**	**21**	**0**	**3**	**20**
කාර්යාල සහායක (කොන්ත්‍රාත් පදනම)		**1**	**0**	**1**	**0**	**1**
මුළු එකතුව -		**667**	**489**	**5**	**176**	**466**

තත්‍ය සේවක සංඛ්‍යාවේ සාරාංශය - 2023.12.31 දක්වා

තනතුර	වැටුප් ක්‍රේතය	ප්‍රධාන කාර්යාලය	දිස්ත්‍රික් කාර්යාල	මුළු එකතුව
අධ්‍යක්ෂ ජනරාල්	(HM 2-1)	1	-	**1**
අධ්‍යක්ෂ	(HM 1-1)	6	-	**6**
පාරිභෝගික සභාවේ ලේකම්	(HM 1-1)	1	-	**1**
නියෝජ්‍ය අධ්‍යක්ෂ	(MM 1-1)	1	-	**1**
සහකාර අධ්‍යක්ෂ	(MM 1-1)	5	-	**5**
සහකාර අධ්‍යක්ෂ - ප්‍රාදේශීය කටයුතු	(MM 1-1)	1	3	**4**
අභ්‍යන්තර විගණක	(MM1-1)	-	-	**-**
විගණන නිලධාරි	(JM1-1)	1	-	**1**
ජ්‍යෙෂ්ඨ ගිණුම් නිලධාරී	(JM 1-1)	1	-	**1**
පද්ධති පරිපාලක	(JM 1-1)	1	-	**1**
ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී	(JM 1-1)	5	21	**26**
රහස්‍ය ලේකම්-සභාපති	(JM 1-1)	1	-	**1**
නීති සහ නීති බලාත්මක කිරීම නිලධාරි / ජ්‍යෙෂ්ඨ නීති සහ නීති බලාත්මක කිරීම නිලධාරි	(JM 1-1)	6	-	**6**
ජ්‍යෙෂ්ඨ පිරිවැය නිලධාරී	(JM 1-1)	1	-	**1**
විමර්ශන නිලධාරි	(MA 5-2)	54	271	**325**
සංඛ්‍යාලේඛන නිලධාරි	(MA 5-2)	1	-	**1**
වෙළඳපල පර්යේෂණ විශ්ලේෂක	(MA 5-2)	-	-	**-**
ලේඛන නිලධාරි	(MA 5-2)	1	-	**1**
පරිපාලන නිලධාරී	(MA 5-2)	1	-	**1**
ගිණුම් නිලධාරි	(MA 5-2)	2	-	**2**
පිරිවැය නිලධාරී	(MA 5-2)	1	-	**1**
මාධ්‍ය නිලධාරි	(MA 5-2)	1	-	**1**
පුස්තකාලාධිපති	(MA 5-2)	1	-	**1**
කැමරාකරු -කොන්ත්‍රාත් පදනම	(MA 2-2)	1	-	**1**
කළමනාකරණ සහකාර	(MA 1-2)	20	16	**36**
රියදුරු	(PL -3)	12	8	**20**
කාර්යාල කාර්ය සහායක	(PL -1)	9	11	**20**
කාර්යාල කාර්ය සහායක - කොන්ත්‍රාත් පදනම	(PL -1)	1	-	**1**
එකතුව		**136**	**330**	**466**

4.5.2 කාර්ය මණ්ඩල සංවර්ධනය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් එහි අදාළ ක්ෂේත්‍රවල කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය කිරීම, අධිකාරියේ සේවාවන්හි ගුණාත්මක බව ඉහළ නැංවීමට දායක වන ආයෝජනයක් ලෙස සලකනු ලැබේ. 2023 හි පැවති කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර පහතින් ඉදිරිපත් කර ඇත.

සේවක කාණ්ඩය	නම සහ තනතුර	පුහුණු වැඩසටහන
JM 1-1	සී.නවෝද්‍යා ගාල්ලගේ මෙනෙවිය. නීති හා බලාත්මක කිරීමේ නිලධාරි	2023 මැයි 17 සිට 30 දක්වා Negotitation Capacity Building of Freetrade Agreement for Sri Lanka. In China සම්මන්ත්‍රණයට සහභාගී වීම.

4.5.3 කාර්ය මණ්ඩල අභිප්‍රේරණය සහ සුභසාධනය

කාර්ය මණ්ඩලයේ සේවා ඵලදායිත්වය වැඩි දියුණු කිරීම සඳහා වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය, සංස්කෘතික හා ආගමික වැඩසටහන්, කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන්, සේවක ඇගයීම වැනි වැඩසටහන් කිහිපයක් වසර තුළ අඛණ්ඩව සිදු කරන ලදී.

4.5.4 පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත සංශෝධන කිරීම.

සංශෝධිත පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇති අතර නීති කෙටුම්පත් සම්පාදක සමග සාකච්ඡා කරමින් පවතී.

4.6 පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව

පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව පරිපාලනමය වශයෙන් ක්‍රියාත්මක වන්නේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය යටතේ වන අතර ප්‍රධාන වශයෙන්ම තරඟ විරෝධී පරිවයන්ට අදාළව අධිකාරිය විසින් යොමු කරන වෙළෙඳපල විමර්ශන වාර්තා විභාග කිරීමටත් තීන්දු ලබා දීමටත් අවශ්‍ය බලය පනත මඟින් සභාවට පවරා තිබේ. පනතේ විධිවිධාන ප්‍රකාරව අධික මිල ගණන් අය කිරීම, වෙළඳපළ දෝෂ සහ වෙළඳපළ හැසිරීම යනාදිය සම්බන්ධයෙන් විමර්ශනය සඳහා මෙම සභාව වෙත යොමු කරනු ලැබේ. අවශ්‍ය කරන අවස්ථාවන්හිදී භාණ්ඩ හෝ සේවාවන් ලබා දිය හැකි උපරිම මිල සීමාවන් නිර්දේශ කිරීම සඳහා සභාවට බලය ලබා දී තිබේ.

තරඟකාරී විරෝධී පිළිවෙත් යටතේ කරන ලද පැමිණිලි සහ උපරිම සිල්ලර මිල නිර්දේශ කිරීම.

ක්‍රියාකාරකම	පැමිණිලි සංඛ්‍යාව		
	ලැබුණු	ප්‍රගතිය	ඉදිරිපත් කරන ලද වාර්තා මත සභාව නිකුත්කළ තීරණ සහ නිර්දේශ
මහජන යහපතට එරෙහිව ක්‍රියාත්මක වන තරඟකාරී විරෝධී භාවිතයන්ට එරෙහිව සහන සැලසීම සහතික කිරීම.	02	03	01
භාණ්ඩ හා සේවාවල මිල සීමාව (උ.සි.මි.) සඳහා නිර්දේශ කිරීම. / අධික මිල ගණන් යටතේ විමර්ශන.	10	05	05

5. විගණිත මූල්‍ය වාර්තාව

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	2023.12.31 දිනට	**2022.12.31 දිනට සංශෝධිත**
වත්කම්	**රුපියල් 000'**	**රුපියල් 000'**
ජංගම වත්කම්		
මුදල් සහ මුදල් සමාන දෑ	67,366	72,420
වෙළඳාම සහ අනෙකුත් ලැබීම්	55,475	66,712
වෙනත් වත්කම් මූල්‍ය වත්කම්	7,237	9,654
ඉන්වෙන්ට්‍රි / තොගය	3,581	3,309
	133,659	**152,095**
ජංගම නොවන වත්කම්		
ආයෝජනය - අධිකාරියේ අරමුදල	520,841	371,292
ආයෝජනය - පාරිතෝෂික අරමුදල	93,417	79,345
වෙනත් ජංගම නොවන මූල්‍ය වත්කම් (කාර්යය මණ්ඩල ණය)	8,163	13,036
කුලී පදනමට ගත් ගොඩනැගිලි	675	700
දේපල, පිරියත සහ උපකරණ	77,676	96,576
	700,772	**560,949**
මුළු වත්කම්	**834,431**	**713,044**
වගකීම්	-	
ජංගම වගකීම්		
උපචිත වියදම්	29,782	33,477
ගෙවිය යුතු සහ වෙනත් වගකීම්	3,804	2,240
	33,586	**35,717**
ජංගම නොවන වගකීම්		
පාරිතෝෂික සඳහා වෙන්කිරීම	144,571	76,560
මුළු වගකීම්	**178,157**	**112,277**
ශුද්ධ වත්කම්	**656,274**	**600,767**
ශුද්ධ වත්කම් / ස්කන්ධය	-	
විලම්භිත ආදායම	65,379	84,173
ප්‍රාග්ධනය සහ සංචිත	590,895	516,594
	656,274	**600,767**
මුළු ශුද්ධ වත්කම් / කොටස්	**656,274**	**600,767**

පිටු 05 සිට 12 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු 13 සිට 53 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි. මෙහි සඳහන් වන්නේ මූල්‍ය ප්‍රකාශ වලට අදාළ ප්‍රධාන කරුණු වේ. මෙකී මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ සම්පූර්ණ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. එසේම මෙම මූල්‍ය ප්‍රකාශය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර ඔවුන් වෙනුවෙන් මෙහි අත්සන් යොදා ඇත.

ඩබ්.එම්.ප්‍රියන්ත
අධ්‍යක්ෂ මූල්‍ය

එච්.එම්.සී බණ්ඩාර
අධ්‍යක්ෂ ජනරාල්

පේ.එම්.සී ජයන්ති විජේතුංග
සභාපති (වැඩ බලන)

සුනිල් ජයලත්
පූර්ණ කාලීන සාමාජික

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
2023 දෙසැම්බර් 31 අවසන් වූ වසර සඳහා මූල්‍ය කාර්යය සාධනය පිළිබඳ ප්‍රකාශය

	2023.12.31 දිනට	**2022.12.31 දිනට සංශෝධිත**
	රුපියල් 000'	**රුපියල් 000'**
ආදායම		
පුනරාවර්තන ප්‍රදාන	548,968	541,500
දඩ මඟින් ලද ආදායම	91,051	37,141
වෙනත් ආදායම්	96,834	60,030
	736,853	**638,671**
වියදම්		
පුද්ගල වේතන	(469,883)	(410,406)
ප්‍රවාහන දීමනා	(11,916)	(8,550)
සැපයුම් සහ පරිභෝජන	(24,730)	(17,005)
නඩත්තු කටයුතු	(22,200)	(11,169)
ගිවිසුම්ගත සේවා	(90,132)	(60,193)
ක්ෂය වීම	(21,963)	(7,710)
වෙනත් මෙහෙයුම් වියදම්	(43,647)	(32,278)
මූල්‍ය පිරිවැය	(44)	(114)
මුළු වියදම්	**(684,515)**	**(547,425)**
කාල සීමාව සඳහා මුළු ශුද්ධ අතිරික්තය /(හිඟය).	**52,338**	**91,246**
විස්තීරණ ආදායම		
විලම්බිත ආදායම්	21,963	7,710
පාරිතෝෂික ප්‍රතිපාදන හිඟය	-	10,102
ප්‍රත්‍යාගණන අතිරික්තය	-	72,780
වර්ෂය සඳහා මුළු විස්තීරණ සම්පූර්ණ ආදායම	**74,301**	**181,838**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

2023 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2023.12.31 දිනට රුපියල් 000'	2022.12.31 දිනට සංශෝධිත රුපියල් 000'
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ		
සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් අතිරික්තය / (හිඟය)	74,301	181,838
ගැලපුම්		
ක්ෂය වීම	21,963	7,710
ක්‍රමක්ෂය	25	25
විලම්භිත ආදායම	(21,963)	(7,710)
ප්‍රත්‍යාගනණ අතිරික්තය	-	(72,780)
ප්‍රතිපාදන මත ස්ථාවර වත්කම්	105	-
පාරිතෝෂික දීමනාව	70,748	(10,102)
පොලී ආදායම	(92,561)	(55,320)
කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් ලාභය	52,618	43,660
කාරක ප්‍රාග්ධනය වෙනස් වීම		
වෙළඳාම් සහ වෙනත් ලැබීම් අඩුවීම්/වැඩිවීම්	11,237	(6,200)
තොග අඩුවීම්/වැඩිවීම්	(272)	(958)
වෙනත් ජංගම මූල්‍ය වත්කම්වල අඩුවීම්/වැඩිවීම්	2,417	(338)
ගෙවිය යුතු අඩුවීම්/වැඩිවීම්	(2,130)	(15,252)
පොලී ලැබීම්	92,561	16,105
පාරිතෝෂික ගෙවීම්	(2,737)	(1,233)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහයන්	153,694	35,783
	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ		
	-	-
පිරියත සහ උපකරණ මිලදී ගැනීම්	(3,169)	(4,359)
ආයෝජන වැඩි වීම්	(163,621)	(23,905)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහයන්	(166,790)	(28,264)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ		
වැඩි කිරීම්/අඩු කිරීම් - දිගු කාලීන ණය (කාර්යය මණ්ඩල ණය)	4,873	1,933
භාණ්ඩාගාර ප්‍රදාන- ප්‍රාග්ධනය	3,169	4,895
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහයන්	8,042	6,828
	-	-
ශුද්ධ වැඩිවීම් / (අඩු වීම්) මුදල් සහ මුදල් සමාන දෑ	(5,054)	14,348
කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ	72,420	58,072
කාලපරිච්ඡේදය අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ		
	67,366	**72,420**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

2023/12/31 දිනට ස්කන්ධය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

රු.'000

විස්තරය	පාලන අස්ථිත්වයේ අයිතිකරුවන්ට අදාල වන				මුළු ශුද්ධ වත්කම්/ කොටස්
	රජයේ දායක ප්‍රාග්ධනය	වෙනත් සංචිත	නැවත ඇස්තමේන්තු අතිරික්තය	සමුච්චිත අතිරික්තයන්/ හිඟයන්	
2023/01/01 දිනට ශේෂය	**11,498**	**10,102**	**17,048**	**554,992**	**593,641**
නැවත ඇස්තමේන්තුගත අතිරික්තය (2022)	72,780			(72,780)	-
පෙර වර්ෂවල ගැලපීම				7,231	**7,231**
ප්‍රතිපාදන වැඩිවීම් ගැලපුම්-වත්කම් **	(105)		-		**(105)**
සංශෝධිත ශේෂය	**84,173**	**10,102**	**17,048**	**489,443**	**600,767**
2023 ශුද්ධ වත්කම්/ස්කන්ධ වෙනස්කම්					
ප්‍රාග්ධනය දායකත්වය	3,169	-			**3,169**
විලම්භිත ආදායම - ක්ෂය වීම	(21,963)	-			**(21,963)**
වර්ෂය සඳහා අතිරික්ත/ හිඟය				74,301	**74,301**
2023/12/31 දිනට ශේෂය	**65,379**	**10,102**	**17,048**	**563,744**	**656,274**

ගිණුම් සඳහා සටහන්

1. ආයතනික තොරතුරු

1.1 1979 අංක 1 දරන පාරිභෝගික ආරක්ෂණ පනත ද, 1987 අංක 1 දරන සාධාරණ වෙළෙඳ කොමිසම් සභා පනත සහ මිල පාලන පනත (පරි. 173) අවලංගු කරමින් සම්මත කරගන්නා ලද 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු අධිකාරිය පනත යටතේ පාරිභෝගික කටයුතු අධිකාරිය ස්ථාපිත කර ඇත.

2011 සැප්තැම්බර් 15 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/58/02 ප්‍රකාර පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, "A" උප කාණ්ඩයේ නියාමන නියෝජිත ආයතනයන්හි "A" කාණ්ඩයේ ආයතනයක් වශයෙන් වර්ග කර ඇත.

1.2 මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

අධිකාරියේ ප්‍රධාන කාර්යය වන්නේ පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සහ අභ්‍යන්තර වෙළෙඳාම විධිමත් කිරීමයි.

1.3 2023 වසර අවසානයේ අධිකාරියේ සේවක සංඛ්‍යාව 497 කි.

1.4 සුවිශේෂී කොටස් හිමිකම / ස්කන්ධය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාරයෙන් ලබා දෙන අරමුදලෙන් යැපෙන ආයතනයකි. අධිකාරිය වෙත සෘජුවම ලැබෙන ආදායමක් වූ දඩ මුදල් ආදායමෙන් 1/3 ක මුදලින් ඇති කරන ලද අරමුදලේ ශුද්ධ ශේෂය මඟින් පාරිභෝගික ආරක්ෂණ අරමුදලේ ස්කන්ධය නිරූපනය වේ.

1.5 රජයේ ප්‍රදාන

රජයේ ප්‍රදාන පිළිගනු ලබන්නේ ප්‍රදානය ලැබෙන බවට සාධාරණ සහතිකයක් ඇති විට සහ ඊට අනුයුක්ත කර ඇති සියලුම කොන්දේසි වලට අනුකූල වන විටය. ප්‍රදාන වියදම් අයිතම් සඳහා අදාළ වන විට එය කාල සීමාව තුළ ආදායමක් (පුනරාවර්තන ප්‍රදානය) ලෙස හඳුනා ගැනේ. ප්‍රදාන වත්කම් අයිතමයකට අදාළ වන විට එය අදාළ වත්කමේ අපේක්ෂිත ආයු කාලය පුරා සමාන ප්‍රමාණවලින් නිකුත් කරන ලද විලම්භීත ආදායමක් (ප්‍රාග්ධන ප්‍රදානය) ලෙස හඳුනා ගැනේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මූල්‍යමය නොවන ප්‍රදාන ලබනවිට එම ප්‍රදානයන් වත්කම්වල නාමික අගයන් වශයෙන් ගැනෙන අතර, සමාන වාර්ෂික වාරික වශයෙන් අදාළ වත්කම ප්‍රතිලාභ ලැබීම සඳහා ප්‍රයෝජනයට ගනු ලබන ආකාරය අනුව අපේක්ෂිත ජීව කාලය තුළ ලාභ හෝ අලාභ වශයෙන් සඳහන් කරන අතර, රාජ්‍ය ප්‍රදාන හා සම්බන්ධ වත්කම් සහ මූල්‍යමය නොවන ප්‍රදාන සාධාරණ අගය මත විලම්භීත ආදායම වශයෙන් ශේෂ පත්‍රයේ සඳහන් කර තිබේ.

2. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් පිළිබඳ කමිටුව විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS) අනුව පාරිභෝගික කටයුතු අධිකාරියේ (CAA) ගිණුම් පිළියෙල කර තිබේ.

2.2 ඓතිහාසික පිරිවැය පදනම මත සහ සිදුවිය හැකි ගිණුම්කරණ වෙනස් වීම් පාදක කරගෙන මූල්‍ය ඇස්තමේන්තු සකස් කර තිබේ.

2.3 දඩ මුදල් ආදායම

2.3.1 අධිකාරියේ සාමාන්‍ය මෙහෙයුම් කටයුතු සඳහා දඩ මුදල් උපයෝගී කර නොගන්නා බැවින්, පෙර ආදායම් ප්‍රකාශන සැකසීමේ දී දඩ මුදල් ආදායම සැළකිල්ලට නොගන්නා ලදී. 2011 වර්ෂයේ සිට මහාභාණ්ඩාගාරයේ අනුමැතිය සහිතව අධිකාරිය විසින් එකී මුදල් ප්‍රයෝජනයට ගන්නා ලදී. එමනිසා දඩ මුදල් උපයනු ලබන ආදායමක් වශයෙන් සළකනු ලබන අතර, දඩ මුදල් ආශ්‍රිත සියළු වියදම් හා ආදායම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි දක්වා තිබේ.

2.3.2 සමුච්චිත අරමුදල රු.63, 190,913.00

මෙමඟින් 2012/12/31 දිනට සමුච්චිත අරමුදල (දඩ ආදායම, සටහන් ගාස්තු, නශ්‍ය භාණ්ඩ විකිණීම සහ ආයෝජන පොළිය) නියෝජනය කරන අතර, මෙම මුදල ආදායමේ කොටසක් ලෙස සලකන බැවින්, එය සංචිතයන්හි කොටසකි. එබැවින් එම මුදල සංචිත යටතේ දක්වනු ලැබේ.

2.3.3 අධිකාරිය විසින් දඩ මුදල් ආදායම වශයෙන් මුදල් ලැබුව ද අදාළ වැටලීම් සිදු කළ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ නිලධාරියා විසින් ලබාදෙන ලද නඩු අංක අදාළ අධිකරණය විසින් මුදල් බැර කිරීමේදී ලබාදෙන නඩු අංක හා තොරතුරු එකිනෙකට වෙනස් වීම හේතුවෙන් ඒවා එම අවස්ථාවේ දී ම දඩ මුදල් ලෙස හඳුනා නොගැණෙන අවස්ථා පවතී. එම මුදල් සත්‍ය වශයෙන්ම අධිකාරිය සතු විය යුතු මුදල් ද නැතහොත් අධිකරණය විසින් වැරදීමකින් එවන ලද මුදල් ද යන්න සත්‍යාක්ෂණය කරන තෙක් සාමාන්‍යයෙන් හඳුනා නොගත් දඩ මුදල් ආදායම් ගිණුමට මාරු කරනු ලැබේ. එබඳු මුදල් ඊළඟ වර්ෂය අවසන් වනතෙක් නිශ්චිතව හඳුනා නොගන්නේ නම් අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබේ.

2.3.4 පූර්ව අත්දැකීම් අනුව, හඳුනා නොගත් දඩ ආදායම් සියල්ල ලැබිය යුතු දඩ මුදල් ලෙස නිරූපණ වේ.

2.4 මූදල් වර්ෂය

අධිකාරියේ මූල්‍ය වර්ෂය දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන ලිත් වර්ෂයයි.

3. වත්කම් පදනම් සහ ඒවායේ අගය තක්සේරු කිරීම

3.1 දේපල, පිරියත සහ උපකරණ

3.1.1. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ස්වකීය ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් ඇස්තමේන්තු සඳහා අපේක්ෂිත හඳුනාගැනීම් වශයෙන් පිරිවැය ආකෘතිය තෝරා ගනු ලබයි. (SLPSAS 7). එබැවින් ශුන්‍ය අගයට ඇති වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම අවශ්‍ය නොවේ.

3.1.2 දේපළ, පිරියත සහ උපකරණ (PPE) ආදියෙහි අගය දැක්වීමේ දී ඒවායේ ශුද්ධ සමුච්චිත ක්ෂය වීම ද, කොටස් ප්‍රතිෂ්ඨාපනය කිරීම ද අන්තර්ගත කරනු ලබයි. දේපළ, පිරියත හා උපකරණ ආදියෙහි අතිශය වැදගත් කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමට ඇතිවිට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ප්‍රතිෂ්ඨාපනය කරන ලද කොටස අගය නොකර නව කොටස් ආශ්‍රිතව ජීව කාලය සහ ක්ෂය වීම හඳුනා ගනී.අළුත්වැඩියා සහ නඩත්තු වියදම් ඒවා වැය කරන ලද ආකාරය අනුව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වනු ලැබේ.

3.1.3 වත්කම් අපේක්ෂිත ක්‍රියාකාරී තත්ත්වයට අවශ්‍ය පරිදි සකස් කිරීම සඳහා දරන්නා වූ ඕනෑම වියදමක් දේපළ, පිරියත හා උපකරණ පිරිවැය තුළ අන්තර්ගත වේ.

3.1.4 කාර්යයන් ක්‍රියාත්මක කිරීම හෝ වත්කම්වල ජීව කාලය ඉහළ නැංවීම සඳහා ස්ථාවරව වත්කම් අත්පත්කර ගැනීම, පුළුල් කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා දරනු ලබන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සැළකේ.

3.2 ක්ෂය වීම

අධිකාරිය විසින් අත්පත් කරගන්නා ලද වත්කම් භාවිතයට ගන්නා ලද මාසය ආරම්භයේ සිට ක්ෂය කිරීම් කරනු ලැබේ.

3.2.1 දේපළ පිරියත සහ උපකරණවල පිරිවැය පහත පරිදි ඔවුන්ගේ ඇස්තමේන්තුගත ආයු කාලය මත කපා හැරීම සඳහා ස්ථාවර පදනමක් මත ක්ෂයවීම් ලබා දී ඇත.

කාර්යාලීය ගෘහභාණ්ඩ සහ උපාංග	10%
කාර්යාල උපකරණ	10%
පරිගණක උපකරණ	20%
පරිගණක මෘදුකාංග සහ වෙබ් නිර්මාණකරණය (අස්පෘශ්‍ය වත්කම්)	20%
මෝටර් වාහන	20%
කාර්යාල කොටස්වලට බෙදීම	20%
පරිභෝජන නොවන	10%

3.2.2 පාරිභෝගික කටයුතු අධිකාරිය ක්ෂයවීම් ගණනය කිරීමේදී සරල රේඛීය ක්‍රමය භාවිතා කරයි.

3.2.3 පුස්තකාල පොත් සඳහා ක්ෂයවීමක් සිදු නොවේ.

3.2.4 වර්ෂයට අදාළ ක්ෂයවීම්වල වටිනාකම වෙනස් ආදායම් ගිණුමට මාරු කරනු ලැබේ.

3.3 ගොඩනැගිලි පරිශ්‍රය - කුරුණෑගල

කුරුණෑගල දිස්ත්‍රික් ලේකම්වරයා විසින් පාරිභෝගික කටයුතු අධිකාරියේ කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය වෙත පවරා ඇති ගොඩනැගිලි පරිශ්‍රය සඳහා ගෙවිය යුතු රුපියල් මිලියන 01ක මුදල ගෙවීම වසර 40 ක කාලයක් සඳහා ක්‍රමක්ෂය කර තිබේ.

3.4 ණය ගැතියන් සහ ලැබිය යුතු දේ

ණය ගැතියන් සහ ලැබිය යුතු දේ ඔවුන් සාක්ෂාත් කර ගැනීමට ඇස්තමේන්තු කර ඇති මුදලෙහි සඳහන් වේ.

3.6 මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ ,අතැති මුදල්, බැංකුවේ මුදල් සහ කෙටි කාලීන ආයෝජන ලෙස අර්ථ දක්වා ඇත. **3.6.1**

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ශුද්ධ මුදල් ප්‍රවාහය, මුදල් සහ මුදල් සමාන දෑ, අතැති මුදල් සහ බැංකුවල තැන්පතු වලින් සමන්විත වේ.

3.7 ස්ථාවර තැන්පතු

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ස්ථාවර තැන්පතු ආයෝජන යටතේ වර්ගීකරණය කර ඇත. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අතීත අත්දැකීම් අනුව ස්ථීර තැන්පතු අදාළ කාල පරිච්ඡේදය තුළ දී ආපසු ලබා ගෙන නොමැති අතර, ස්ථීර තැන්පතු බහුතරයක් අවම වශයෙන් වසර තුනක්වත් පවතින බවට උපකල්පනය කළ හැකිය. මූලික වශයෙන් ස්ථීර තැන්පතු පිරිවැය අගය මත ගණනය කරනු ලැබේ.

4 . වත්කම් සහ ප්‍රතිපාදන

4.1 ගෙවිය යුතු මුදල්

ගෙවිය යුතු මුදල් ඒවායේ පිරිවැය අගය මත සඳහන් කර ඇත.

4.2 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සතුව නිශ්චිත විශ්‍රාම ප්‍රතිලාභ දෙකක් පවතින අතර, එම ක්‍රම දෙක සඳහාම දායකත්වය දැරිය යුතුය.

4.2.1 අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ සැළැස්ම- පාරිතෝෂිතය

පාරිතෝෂිතය යනු නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මකි. පාරිතෝෂිත පනත අනුව පාරිතෝෂිත දීමනා ගෙවීමට අධිකාරිය බැඳී සිටී. මෙම වගකීම ඉටු කිරීම සඳහා, සේවයේ පළමු වසරෙන් ආරම්භ වන සේවා කාලය අවසන් වූ සෑම වසරක් සඳහාම සියලුම සේවකයින්ගේ මූල්‍ය වර්ෂයේ අවසාන මාසයේ මාසික වැටුප මත පදනම්ව ගණනය කරන ලද මුදලකට සමාන ප්‍රතිපාදනයක් ශේෂ පත්‍රයේ ඉදිරියට ගෙන යනු ලැබේ. වසරක් ආරම්භයේ දී ගෙන එන ලද ප්‍රතිපාදන සහ වසරක් අවසානයේ දී ගෙන යන ලද ප්‍රතිපාදන අතර ඇති වන වෙනසෙහි ප්‍රතිඵලය ආදායම් ප්‍රකාශයේ දක්වා ඇත.
පාරිතෝෂික පනතට අනුව අවම වශයෙන් වසරක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින් සඳහා පාරිතෝෂිත ප්‍රතිපාදන ගණනය කර ඇත **.** තවද 2022 වර්ෂයේ රජයේ විගණන නිරීක්ෂණ මත පදනම්ව විගණන සහ කළමනාකරණ කමිටුවේ දී තීරණය කළ පරිදි වර්ෂය සඳහා සම්පූර්ණ වසර ප්‍රතිපාදන වෙනුවට මූල්‍ය වර්ෂයේදී සේවකයා විසින් සත්‍ය සම්පූර්ණ කරන ලද සේවා කාලය මත පදනම්ව ප්‍රතිපාදන සලසා ඇත**.** ඒ අනුව**,** සමුච්චිත 2023.12.31 දිනට වසරක් සම්පූර්ණ කළ සේවකයන් සඳහා ප්‍රතිපාදන රු**.**144,614,179/- කි.

	රු.
වසර 5කට වැඩි පාරිතෝෂික සේවකයින්ගේ සේවය සඳහා ප්‍රතිපාදන	144,570,464
2023 සඳහා ආයෝජනය කළ යුතු ප්‍රතිපාදනය	70,747,702
ආයෝජිත ප්‍රතිපාදනය	30,000,000
2023.12.31 දිනට කළ යුතු ආයෝජනය	40,747,702

ආයෝජනය සඳහා ප්‍රමාණවත් අරමුදලක් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කර නොමැති බැවින්, ආයෝජනය කිරීමට ඇති සමුච්චිත ශේෂය පවතී.

4.2.2 ව්‍යවස්ථාපිත දායක මුදල් සැලසුම් / සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල

අදාළ ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාරව සියලුම සේවකයින් සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම් ලබයි. සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල වෙත සේවකයින් ආවරණය කරමින් ආයතනය විසින් ගෙවනු ලබන දායක මුදල් ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස පෙන්වා දී ඇත.සේවකයාගේ දළ වැටුපෙන් 15%ක් සහ 3%ක් බැහින් වූ මුදල් අධිකාරිය විසින් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල වෙත දායක මුදල් වශයෙන් ගෙවනු ලබයි.

4.3 අවිනිශ්චිත වගකීම්.

4.3.1 2023.12.31 දිනට පාරිභෝගික කටයුතු අධිකාරියට එරෙහිව අධිකරණයේ නඩු 35ක් ඇත.
පෙනී සිටි අධිකරණ අනුව මෙම නඩු වර්ග පහත පරිදි වේ.

උසාවිය	නඩු ගණන
ශ්‍රේෂ්ඨාධිකරණය	09

අභියාචනාධිකරණය	13
මහාධිකරණය	08
දිසා අධිකරණය	05
මුළු එකතුව	35

මෙම නඩු අතරින් විශාල ප්‍රමාණයක් ගොනු කර ඇත්තේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් පාරිභෝගිකයින් වෙත ලබාදෙන ලද තීරණවලට එරෙහිවය. ඇතැම් නඩු අධිකාරිය විසින් පළ කරන ලද ගැසට් පත්‍රවල වගන්තිවලට හෝ ගැසට් පත්‍රවල කොටසකට එරෙහිව පවරන ලද නඩු වේ. කෙසේ නමුත්, අගතියට පත් පාර්ශවයන් රැසක් අධිකාරියේ තීරණය අවලංගු කිරීම, සංශෝධනය කිරීම හෝ පළ කරන ලද ගැසට් පත්‍ර අවලංගු කිරීම අපේක්ෂා කරන බැවින්, අවිනිශ්චිත අගයෙහි ප්‍රමාණය නිශ්චය කර නොමැත.

4.3.2.1 පාරිභෝගික ආරක්ෂාව සහතික කිරීම හා ඇතැම් නිෂ්පාදන හඳුනාගැනීම සඳහා තාක්ෂණය පදනම් කරගත් පාරිභෝගික ආරක්ෂණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට SICPA සෙකුරිටි සමාගම යෝජිත වූ නමුත්, ගිවිසුම්ගත පරිදි පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් එම පද්ධතිය ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් පැන නැඟුන ආරවුල බේරුම් කිරීම සඳහා අයදුම්පතක් ගොනු කර ඇත.

4.3.2.2 ක්‍රියාත්මක නොකිරීමට හේතුව

2014.02.24 දින අංක 49 දරන විධානය නිකුත් කිරීමෙන් අනතුරුව නිශ්චිත භාණ්ඩ නිෂ්පාදනය සම්බන්ධයෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය නිෂ්පාදනය කරන්නන් දැනුවත් කර ඇති අතර, මේ සම්බන්ධයෙන් සාකච්ඡා කීපයක් ද පැවැත්විණි.එම විධානය ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් පැවති සාකච්ඡා අසාර්ථක වූ බැවින්,ශ්‍රී ලංකා ජල බෝතල් නිෂ්පාදකයින්ගේ සංගමය, බීම වර්ග නිෂ්පාදකයින්ගේ සංගමය සහ රූපලාවන්‍ය නිෂ්පාදන නිෂ්පාදකයින් විසින් මෙම විධානය ක්‍රියාවට නැංවීම නවතාලීම සඳහා 2014/08/14 දින අභියාචනාධිකරණයේ (CAA/Writ/281/2014) ඉල්ලීමක් ගොනු කර ඇති අතර, මෙම නඩුව මේ වනවිටත් අභියාචනාධිකරණයේ විභාගවෙමින් පවතී.

4.3.2.3. SICPA සෙකුරිටි සමාගම විසින් ඇතිකරගත් ගිවිසුම ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් , රුපියල් බිලියන 2.716ක් හෝ විනිශ්චය සභාව විසින් තීරණය කරනු ලබන වෙනත් එවැනි මුදලක් හෝ විකල්ප වශයෙන් රුපියල් බිලියන 3.887 විනිශ්චය සභාව විසින් තීරණය කරනු ලබන වෙනත් එවැනි මුදලක් සහ හිමිකම් කියන ලද හානි සඳහා පොළිය සහ බේරුම්කරණයේ සියලු පිරිවැය ඉල්ලා බේරුම්කරණ නඩුවක් ගොනු කර ඇත.

4.3.2.4. ඒ අනුව බේරුම්කරණ නඩු විභාගය අවසන් කර 2022.05.10 දින බේරුම්කරණ ප්‍රදානය ලබා දෙන ලදී. එම තීන්දුව ආයතනයට අවාසි සහගත බැවින්, අධිකාරිය විසින් බේරුම්කරණ ප්‍රදානයට එරෙහිව වාණිජ මහාධිකරණයේ අංක CHC/626/22/ARB නඩුව ගොනු කර ඇති අතර, බේරුම්කරණ මණ්ඩලය විසින් ලබාදෙන ලද නියෝගය ක්‍රියාත්මක කිරීම සඳහා SICPA සෙකුරිටි සමාගම විසින් වාණිජ මහාධිකරණයේ නඩුවක් ගොනු කර ඇත. නඩු දෙකම 2024.04.01 දින විභාගය සඳහා නියම කර ඇත.

5. ආදායම

ආදායම් හඳුනාගැනීම

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත ලැබෙයැයි අදහස් කරන ආදායම් ප්‍රමාණය හඳුනාගෙන ඇත්නම් ආදායම නිශ්චය ලෙසම ගණනය කළහැකිය.

පොලී ආදායම

නාමික පොළී අනුපාතය භාවිත කර ස්ථාවර තැන්පතු සඳහා පොළී ආදායම ගණනය කරනු ලැබේ. ස්ථාවර තැන්පතු වල සාමාන්‍ය පොලී අනුපාතය 10.5% ක් වේ.

රජයේ ප්‍රදාන

රජයේ ප්‍රදාන පිළිගනු ලබන්නේ ප්‍රදානය ලැබෙන බවට සාධාරණ සහතිකයක් ඇති විට සහ ඊට අනුයුක්ත කර ඇති සියලුම කොන්දේසි වලට අනුකූල වන විටය. ප්‍රදාන වියදම් අයිතම් සඳහා අදාළ වන විට එය කාල සීමාව තුළ ආදායමක් (පුනරාවර්තන ප්‍රදානය) ලෙස හඳුනා ගැනේ. ප්‍රදාන වත්කම් අයිතමයකට අදාළ වන විට එය අදාළ වත්කමේ අපේක්ෂිත ආයු කාලය පුරා සමාන ප්‍රමාණවලින් නිකුත් කරන ලද විලම්භීත ආදායමක් (ප්‍රාග්ධන ප්‍රදානය) ලෙස හඳුනා ගැනේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මූල්‍යමය නොවන ප්‍රදාන ලැබෙන විට, වත්කම සහ ප්‍රදානය නාමික ප්‍රමාණවලින් දළ වශයෙන් සටහන් කර වත්කමේ අපේක්ෂිත ආයු කාලය පුරා ආදායම් ප්‍රකාශයට මුදා හරිනු ලැබේ. (IAS 20).

6.විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

(16)

මගේ අංකය / எனது இல. / My No. } ටීඒඕ/ඊ/සිඒඒ/ එෆ් එස්/2023 මඹේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2024 ජූලි 12 දින

සභාපති

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) අධිකාරියේ ප්‍රතිපත්තිමය ක්ෂය අනුපාතයෙන් බැහැරව ස්ථාවර වත්කම් ක්ෂය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය රු.3,619,046 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2024 වර්ෂය තුළදී ස්ථාවර තැන්පත්වල කරන ලද ආයෝජනය රු.18,000,000 ක් සමාලෝචිත වර්ෂයේ ආයෝජන ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන් ආයෝජන වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.86,261,778ක් වුවද, එය රු.78,064,586ක් වශයෙන් රු.8,197,192 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. තවද, පාරිතෝෂික අරමුදල් ආයෝජන ආදායම රු.9,735,679ක් වුවද, එය රු.14,496,105ක් වශයෙන් රු.4,760,426 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සේවකයින්ගේ සේවා කාලය පූර්ණ වර්ෂයක් සම්පූර්ණ වී නොතිබියදී පූර්ණ වර්ෂයක් සඳහා පාරිතෝෂික ගණනය කිරීම සහ ඉකුත් වර්ෂයේ පාරිතෝෂික ප්‍රතිපාදනය වැඩියෙන් දැක්වීම සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදී ගැලපීම් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික ප්‍රතිපාදනය රු.8,930,758 ක් වැඩියෙන් ද, වර්ෂයට අදාල පාරිතෝෂික ඌණ වෙන් කිරීම් රු.1,784,559 ක් වැඩියෙන් ද , රඳවාගත් ඉපැයීම් රු.7,146,199ක් අඩුවෙන් ද දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 අධිකාරියේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුලත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අධිකාරියේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි

අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ නත්ත්වාගණනය කළ මාතය සඳහා පදනම් කොටගත් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ මතය සඳහා පදනම් කොටගත් (ඇ) හා (ඈ) මඟින් දක්වා ඇති නිරීක්ෂණයන් හැර මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම හේතු, පහත සඳහන් ප්‍රකාශ කිරීමට කරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාගාකාරයකින් සාමාන්‍ය වාණිජමය නත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (c) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (f) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රයෝජනය කර හෙළිකං කර නොමැති බව

2.3 වෙනත් කරුණු

(අ) 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ සංශෝධන කටයුතු 2004 වර්ෂයේදී ආරම්භ කර වර්ෂ කීපයකදී පනතේ වගන්ති 30 ක් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම හැර සමාලෝචිත වර්ෂය වන විට වසර 19 ක් ගත වී ඇතත් පනත සංශෝධන කටයුතු අවසන් වී නොතිබුණි.

(ආ) පනතේ වගන්ති අංක 17 ප්‍රකාරව චෙළෙන්දෙකු විසින් යම් භාණ්ඩයක් ලී චෙළෙන්දාගේ සාමාන්‍ය වෙළඳ අවශ්‍යතාවයන් ඉක්මවන ප්‍රමාණයකින් මනුගේ වෙළඳ ව්‍යාපාරික ස්ථානයෙහි හෝ වෙනත් යම් ස්ථානයක හෝ සඟවා තබා ගැනීම නොකළ යුතු වුවද, වෙළඳපොල තුල කිරි සම්බා , සීත්තර , ගෑස් , කිරි පිටි , සීනි , බී ඵුණු , පොහොර වැනි භාණ්ඩවල හිඟයන් වාර්තා වූ සමාලෝචිත වර්ෂය තුල දී ඉහත වගන්තිය යටතේ අධිකාරිය විසින් වැටලීම් සිදුකර නොතිබුණි.

(ඇ) දේශීය කිරි සම්බා සහල් සඳහා උපරිම සිල්ලර මිලක් පනවා තිබූ සමාලෝචිත වර්ෂයේ දී වෙළඳපොල තුල කිරි සම්බා සහල් සම්බන්ධයෙන් දැඩි හිඟයක් පැවතුණි. එසේ වුවද , කිරි සම්බා සහල් සම්බන්ධයෙන් වැටලීම් 596 ක් සිදුකර තිබුණු අතර එය අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ සිදුකරන ලද සමස්ත වැටලීම් සංඛ්‍යාව වූ 24,848 න් සියයට 2 ක් පමණක් විය.

(ඈ) වෙළඳපොල තුල වරින් වර මිල සංශෝධනයන්ට ලක් වූ සහ හිඟ තත්ත්වයන් වාර්තා වූ ගෘහස්ථ ගෑස් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුල වැටලීම් 32ක් සිදු කර තිබුණු අතර එය සමාලෝචිත වර්ෂයේ අධිකාරිය විසින් සිදුකරන ලද සමස්ත වැටලීම් සංඛ්‍යාව වූ 24,848 න් සියයට 1 ක් පමණක් වී තිබුණි.

(ඉ) අනාරක්ෂිත හා තත්ත්වයෙන් බාල නිෂ්පාදන මඟින් පාරිභෝගිකයන් සුරක්ෂිත කිරීම සඳහා හඳුනාගත් නිෂ්පාදන කීපයක් සම්බන්ධයෙන් ආරක්ෂිත ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා ස්ථිරසර්ලන්තයේ එක් සමාගමක් සමඟ 2014 ජනවාරි මස 24 දින ගිවිසුමකට එළඹ තිබුණි. ඒ

සම්බන්ධයෙන් නිකුත් කර තිබූ විධාන අංක 49 නිශ්ප්‍රභා කරවා ගැනීම සඳහා භාණ්ඩ නිෂ්පාදන සමාගම නීතියක් විසින් අධිකාරියට විරුද්ධව මහා අධිකරණයේ ගොනු කර තිබූ ඉල්ලුම්පත්‍රය සඳහා මහා අධිකරණය මඟින් විධානය ක්‍රියාත්මක කිරීම වලක්වමින් අතුරු නියෝගයක් නිකුත් කිරීම හේතුවෙන් එම ස්විට්සර්ලන්ත සමාගම සමඟ එළඹී ගිවිසුමට අනුකූලව වාහනයේ කටයුතු ඉදිරියට කරගෙන යාමට නොහැකිව තිබුණි.

ගිවිසුම ක්‍රියාත්මක නොවීම හේතුවෙන් සමාගම විසින් ඒකපාර්ශවීයව ගිවිසුම අවලංගු කර ගිවිසුම ප්‍රකාරව සම්පූර්ණ ආයෝජන මුදල වන රු.බිලියන 2.716 ක මුදලක් ගෙවන ලෙස ඉල්ලා අධිකාරියට එරෙහිව 2018 වර්ෂයේදී ජාත්‍යන්තර බෙරුම්කරණ අධිකරණයේ නඩුවක් ගොනු කර තිබුණි. බෙරුම්කරණ නඩුව සඳහා අවසාන ප්‍රදානය 2022 මැයි 10 දින ලබා දී තිබුණු නියෝගය අනුව අධිකාරිය විසින් සමාගම වෙත රු. බිලියන 2.716 ක් ද, බෙරුම්කරණ ගාස්තුව වශයෙන් ඇ.ඩො. 325,000 ක මුදලක් ද ගෙවියයුතු විය. බෙරුම්කරණ නඩුවේ අවසාන ප්‍රදානයට එරෙහිව 2022 ජූලි 07 දින අධිකාරිය විසින් කොළඹ වාණිජ මහාධිකරණයේ පෙත්සමක් ගොනු කර තිබුණු අතර මේ සම්බන්ධයෙන් අධිකාරිය විසින් අභ්‍යන්තර විමර්ශණයක් පවත්වා වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි.

(ඒ) පනතේ 12 වන වගන්තිය යටතේ නියමකර ඇති ප්‍රමිති හා පිරිවිතරවලට අනුකූල වන්නේ ද යන්න පරීක්ෂා කිරීමට අධිකාරියට ලැබෙන පැමිණිලි හා කාලීනව ගැටලුකාරී අවස්ථාවන්වලදී සාම්පල පරීක්ෂාවන් සිදුකළ යුතු වේ. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේ ප්‍රමිති අනිවාර්ය කර තිබූ භාණ්ඩ වර්ග 34 න් තෝරා ගත් භාණ්ඩ වර්ග ඇතුළත් භාණ්ඩ වර්ග 29 ක් සම්බන්ධයෙන් සාම්පල 133 ක් පමණක් පරීක්ෂා කර තිබුණි. ඒ අනුව අධිකාරිය විසින් භාණ්ඩ හා සේවාවන්හි ප්‍රමිතිය සම්බන්ධයෙන් අදාළ පරීක්ෂණ ප්‍රමාණවත් පරිදි සිදු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඓ) බිත්තර සම්බන්ධයෙන් වීඝාල ණයක් පැවති සහ පාලන මිලක් පනවා තිබුණු 2023 ජනවාරි සිට මැයි දක්වා මාස 05 ක කාලපරිච්ඡේදය තුළ බිත්තර සම්බන්ධයෙන් රට තුළ සිදුකර තිබූ සමස්ත වැටලීම් සංඛ්‍යාව 1179 ක් වූ අතර, ඒ අනුව එක් මාසයක් තුල සිදුකර තිබූ වැටලීම් සංඛ්‍යාවෙහි සාමාන්‍යය 236 ක් වී තිබුණි. කෙසේ වුවද, විමර්ශන නිලධාරීන් 277 ක් සේවයෙහි යොදවා තිබීම හේතුවෙන් එක් විමර්ශන නිලධාරියෙකු විසින් මාසයක් තුල සිදු කරන ලද බිත්තර වැටලීම් සංඛ්‍යාවෙහි සාමාන්‍යය 01 කටත් අඩු වී තිබුණි.

(ඔ) පාරිභෝගික ගැටළු ක්ෂණිකව ඉදිරිපත් කිරීම සහ පාරිභෝගිකයන්ට වෙළඳපොල මිල ගණන් දැන ගැනීම සඳහා 2015 වර්ෂයේදී 1977 දරන පාරිභෝගික විමසුම් සේවා (1977 Interactive Mobile Service) මෘදුකාංගය වෙනුවෙන් අධිකාරිය විසින් රු.5,401,428 ක් සහ මෙම වාහපෘතිය ජනතාව වෙත ප්‍රචාරණය කිරීම සඳහා රු.6,117,480 ක් වැය කර තිබුණි. කෙසේ වුවද, තාක්ෂණික ගැටලු පැනනැගීම සහ භාණ්ඩ මිලගණන් යාවත් කාලීන නොවීම වැනි

අරමුණු ඉටු නොවීම හේතුවෙන් ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කරන ලද කාර්යයන් ඉටු වී නොනිබුණි.

(ඇ) 2018 සැප්තැම්බර් 14 දින පත් කරන ලද අධිකාරියේ අධ්‍යක්ෂ ජෙනරාල් වරයාගේ සේවය 2020 පෙබරවාරි 14 දින සාධාරණ හේතු ඉදිරිපත් කිරීමෙන් තොරව අවසන් කිරීමට විරුද්ධව නිලධාරියා විසින් අභියාචනාධිකරණයේ නඩුවක් ගොනු කර තිබුණු අතර එම අවසාන ප්‍රධානය අනුව නීත වැටුප් සහ දීමනා ඇතුලත්ව රු.1,990,891ක මුදලක් අධිකාරිය විසින් නිලධාරියා වෙත ගෙවීමට සිදු වී තිබුණි.

(ඈ) 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතේ වගන්ති අංක 27 අනුව අමාත්‍යවරයා විසින් නිරණය කරනු ලබන රුපියල් ලක්ෂයක් නොඉක්මවන වාර්ෂික ගාස්තුවක් ගෙවීම මත සෑම වෙළෙන්දෙකුම අධිකාරියෙහි ලියාපදිංචි විය යුතු බවට දක්වා නිබුණ ද අධිකාරිය විසින් වෙළඳුන් ලියාපදිංචි කිරීම සිදු කර නොනිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය තුල මධ්‍යම කළමනාකරණ මට්ටමේ සහකාර අධ්‍යක්ෂ තනතුරු 15 ක් , කණිෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 08 ක්, සහ මෙහෙයුම් මට්ටමේ විමර්ශන නිලධාරි තනතුරු 104 ක් සහ පිරිවැය/ගිණුම් නිලධාරි තනතුරු 12ක් පුරප්පාඩු වී තිබුණි.

ඩබ්ලිව්.ඒ.ඒ.වික්‍රමරත්න
විගණකාධිපති

7. <u>විගණකාධිපති වාර්තාවේ කරුණු සම්බන්ධ සභාපතිතුමාගේ නිරීක්ෂණ හා යෝජිත ක්‍රියාමාර්ග</u>

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති විසින් හඳුනාගෙන ඇති විගණන විමසුම් සඳහා පැහැදිලි කිරීම් හා වර්තමාන තත්ත්වය පිළිබඳ මාගේ පැහැදිලි කිරීම් පහත සඳහන් කරමි.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

1.2 මතය සඳහා පදනම

(අ)ආයතනයේ අගය ශූන්‍ය වූ ස්ථාවර වත්කම්වල ඵලදායී ජීවිත කාලය නැවත තක්සේරු කිරීම සිදු කර ඇති අතර, ක්ෂය ගණනයේ දී ඵලදායී ජීවිත කාලය වෙනුවට පෙර ක්ෂය අනුපාත යොදා ගැනීම හේතුවෙන් සිදුවී ඇති දෝෂය නිවැරදි කිරීමට කටයුතු කරමි. ඒ අනුව ඉදිරියේ දී ඵලදායී ජීවිත කාලය අනුව ක්ෂය ගණනය සිදුකෙරෙන ඇත.

(ආ)මෙම C/I No. 195 7632 අංක දරන රුපියල් මිලියන 18 වටිනාකම වූ ස්ථාවර තැන්පතුව සඳහා වූ චෙක්පත නිකුත්කර ඇත්තේ 2023 දෙසැම්බර් 29 වන දින වන හෙයින් එය ආයෝජන ගිණුමට හර කිරීම එදිනටම සිදුකර ඇත. මෙම මුදල ආයතනයේ මුදල් ශේෂයෙන් අඩුවීම සිදුවන නිසා එදිනට ගිණුම්ගත කර ඇත. මෙම කාල සීමාවේ දී තිබූ නිවාඩු දින නිසා අදාළ බැංකුව චෙක්පත නිෂ්කාශනය සිදුකර ඇත්තේ 2024 ජනවාරි 04 දින වන අතර, ස්ථාවර තැන්පතු දිනය ලෙස නිෂ්කාශනය දිනය සටහන් කර ඇත. කෙසේවෙතත් මෙම නිෂ්කාශන කාලසීමාව මාර්ගස්ථ මුදල් ලෙස නැවත සටහන් කිරීමෙන් ආයෝජන ගිණුම නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

(ඇ)සමාලෝකිත වර්ෂයට අදාළ ස්ථාවර තැන්පතු පොලී ආදායම අදාළ දින හා අනුපාතයන්ට අනුව ගළපා ගිණුම්ගත කරන ලදී.එහිදී 8,197,192ක් අඩුවෙන් ගිණුම්ගත කිරීමේ වරද නිවැරදි කර අදාළ සංසන්ධනාත්මක ගිණුම් ප්‍රකාශ පිළියෙල කිරීමට කටයුතු කරමි.

(ඈ)සමාලෝචිත වර්ෂයට අදාළ පාරිතෝෂික අරමුදල් ආයෝජන ආදායම අදාළ දින හා අනුපාතයන්ට අනුව ගළපා ගිණුම්ගත කිරීම සිදුකරන ලදී.එහිදී රු.4,760,426ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබෙන බැවින්, එම වරද නිවැරදි කර අදාළ ගැළපීම් සිදුකර සංසන්දනාත්මක ගිණුම් ප්‍රකාශ පිළියෙල කිරීමට කටයුතු කරමි.

(ඉ)පාරිතෝෂික ප්‍රතිපාදනය ගණනය කිරීමේ දී සේවකයින්ගේ සේවා කාලය ආසන්න මාසයට ගැලපීම හේතුවෙන් මෙම පාරිතෝෂික ප්‍රතිපාදන ගණනය කිරීමේ දෝෂය සිදු වී ඇත. විගණන නිරීක්ෂණයට අනුව පාරිතෝෂික ගණනය කිරීමේ දී සේවා කාලය වර්ෂයන් සම්පූර්ණ වූ සේවකයන් සඳහා පමණක් ගණනය සිදුකිරීමෙන් මෙම දෝෂය නිවැරදි කරගත හැක.එම නිවැරදි ගණනය කිරීම සංසන්දනාත්මක මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමට උපදෙස් ලබාදී ඇත.

1.3 අධිකාරියේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.2.2(අ)1.කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ අංක 02/2016 හා 2016.04.25 දිනැති චක්‍රලේඛ විධිමත්ව රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල අයත් අමාත්‍යාංශ ලේකම්වරුන් සහ එම ආයතන ප්‍රධානීන් වෙත විධිමත්ව නිකුත් කර ඇත. ඒ අනුව,එම චක්‍රලේඛයට ඇමුණුම් වශයෙන් පවතින ජ්‍යෙෂ්ඨ කළමනාකරණ HM 1-1 සේවා කාණ්ඩයේ උපලේඛන I හා II යටතේ ඇතුළත් වගුවලට අනුව එම සේවා කාණ්ඩයට අදාළ සේවකයින් සඳහා වැටුප් ගෙවීමේ කටයුතු අධිකාරිය විසින් සිදු කර ඇත.

2. ඉහත කළමනාකරණ සේවා චක්‍ර ලේඛය සඳහා සංශෝධනයක් 2016.10.21 වන දින නිකුත් කර ඇති අතර, එමඟින් ඉහත අංක 1හි සඳහන් වැටුප් සංශෝධනයක් සිදුකර ඇත. එම සංශෝධනය ඇතුළත් චක්‍රලේඛය විධිමත්ව මෙම අමාත්‍යාංශය වෙත හෝ අධිකාරිය වෙත එවා නොතිබුණි. ඉහතින් සඳහන් කළ පරිදි විගණන කාර්යාලය විසින් වසර 7කට පසුව 2024.01.08 දින ටීඑස්/ඊ/සීඒඒ/2023/AQ 03 විගණන විමසුම නිකුත් කරන තෙක් විගණන කාර්යාලයේ අවධානය ද ඒ කෙරෙහි යොමු වී ඇති බවක් දක්නට නොමැත.

3. මෙම අධිකාරියේ සේවකයින් සඳහා කම්කරු නීති බලපැවැත්වෙන බැවින්, සාප්පු හා කාර්යාල පනතේ සේවා කොන්දේසි යටතේ වන බලයලත් අඩු කිරීම්වලට පරිබාහිරව අඩු කිරීමක් වන එම සේවක වැටුප් අඩු කිරීම් වන වසර 7ට වඩා වැඩි කාලයක් සඳහා එම වැටුප් අඩු කිරීම සඳහා කම්කරු කොමසාරිස්වරයාගෙන් නිර්දේශය ලබාගැනීම අනිවාර්ය බව එම දෙපාර්තමේන්තුවේ නීති අංශය විමසීමෙන් අධිකාරියට දැන ගැනීමට ඇත. එහෙත් ඉදිරියේ දී එම සේවා කාණ්ඩය සඳහා බඳවා ගනු ලබන සේවකයින් සඳහා එම සංශෝධිත වැටුප් අනුව එම බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.

4. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් මෙයට පෙර වැටුප් සංශෝධනයක් සිදුකරන අවස්ථාවක දී එම සංශෝධන හේතුවෙන් කිසියම් සේවකයකුගේ හෝ සේවා කාණ්ඩයක පවතින වැටුප් අඩු වන්නේ නම් ඉහතින් සඳහන් කළ පරිදි කම්කරු නීතියට පටහැනි නොවන ලෙස එම සේවකයින්ට පෞද්ගලික වන ලෙස ඒ අවස්ථාවේ දී ඔවුන් ලබමින් සිටි වැටුප් අඩු කිරීමකින් තොරව දිගටම ගෙවීම් සිදු කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා දී ඇති බැවින්, මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කර එකී තීරණ පරිදි ඉදිරි කටයුතු සිදු කර වාර්තා කරමි.

(ආ) ආයතනයට චෙක්පත් ලැබීමෙන් පසු ඒ සඳහා රිසිට්පතක් නිකුත් කිරීමේ දී එය මුදල් පොතෙහි සහ බැංකු සැසඳුමෙහි ස්වයංක්‍රීයව සටහන් වීම සිදුවේ. එමනිසා මෙම රු.271,332ක් වූ අංක 0117303 දරන චෙක්පත හා රු.28,997ක් වූ අංක 336990 දරන චෙක්පත ආයතනයට ලැබීමෙන් පසු ඉහත පරිදි පොත්වල සටහන් වී ඇත. නමුත් මෙම චෙක්පත් ආයතනයට ලැබෙන විට කාලය ඉකුත්වීම හේතුවෙන් බැංකු ගිණුමෙහි තැන්පත් නොකර දින දීර්ඝ කිරීමට නැවත අදාළ මහේස්ත්‍රාත් අධිකරණ වෙත ආපසු යවා ඇත. එම අවස්ථාවේ දී නිකුත් කළ රිසිට්පත් අවලංගු නොකිරීම හේතුවෙන් මෙම දෝෂය පැණ නැගී ඇත.මේ වනවිට එම දෝෂය නිවැරදි කිරීමට අදාළ රිසිට්පත් අවලංගු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

2.2.4.(අ) අදාළ ආයතනය සමඟ අධිකාරිය ගිවිසුම්ගත වූයේ 2014.01.20 දින සිට මූලික වශයෙන් අවුරුදු පහක් සඳහා වන අතර, ඉන් පසුව ගිවිසුම දීර්ඝ කිරීමක් සිදු නොවිනි. නමුදු 1977 කෙටි දුරකථන අංකය පාරිභෝගික පැමිණිලි ලබාගැනීම සඳහා වර්තමානයේදී ද සාර්ථකව භාවිතා කරනු ලබයි. පැමිණිලිකරු වෙත විමර්ශනයේ ප්‍රගතිය දැනුම් දීම සඳහා නියමු ව්‍යාපෘතියක්ද ක්‍රියාත්මක කිරීමට වර්තමානයේ කටයුතු කරමින් පවතී.

මූලික අරමුණුවල දී සමහර අරමුණු ඉටුකර ගැනීම සඳහා අමාත්‍යාංශවල විෂය පථයන් අවස්ථා කිහිපයක දී වෙනස් වීමත් ඒ අනුව, එම ආයතන අතර සහ සම්බන්ධතාවය ගිලිහීයාමත් බාධාවක් විය.

නමුත් මෙහි ප්‍රධාන අරමුණක් වන පාරිභෝගික පැමිණිලි ලබා ගැනීමත් ඊට අවශ්‍ය කඩිනම් පියවර ගැනීමත් අඛණ්ඩව සිදු කරනු ලබයි.

මේ වන විට 1977 කෙටි දුරකතන අංකයට ලැබෙන පැමිණිලි දිස්ත්‍රික්ක වෙත යොමු කර එහිදී ගනු ලබන පියවර කෙටි පණිවිඩයක් මඟින් පාරිභෝගිකයන් වෙත දැනුම්දීමට ද නියමු ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත.

මෙම ගැටළුව පිළිබඳව 2024 මැයි 07 වන දින පැවති කෝප් කමිටුවේ දී ද සාකච්ඡාවට භාජනය විය. එහිදී එවකට වැඩබලන සභාපතිතුමිය ඉහත ගැටළු පිළිබඳව පැහැදිළි කිරීමක් කළ අතර, එම දුර්වලතාවයන් අවම කර ගැනීම හා මෙමඟින් ඉටුකර ගත නොහැකි වන කාර්යයන් වඩාත් කාර්යක්ෂමව ඉටු කරවා ගැනීමට ආයතනයට නව MIS පද්ධතියක් හඳුන්වා දීමට අපේක්ෂා කරන බව දන්වන ලදී.

(ආ) උපායදූත මුදල් හා අනෙකුත් පද්ධති සම්බන්ධ සේවක පුහුණුවීම් ද ඒ හා අනුශාංගික කටයුතු ද සිදුකරමින් තිබූ අතර, එම පද්ධතීන්වල රාජකාරියේ නිරතව සිටි පුහුණු නිලධාරීන් සේවය අතහැර යාමේ ප්‍රවණතාවය මත මෙම මෘදුකාංග භාවිතයේ යම් පසුබෑමක් සිදු වූ අතර, එම ගැටළු හා පද්ධතියේ වර්තමාන තත්ත්වයන්ට අනුව යාවත්කාලීන නොවීම යන ගැටළු ද හඳුනාගෙන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සඳහා නව කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීමට මේ වනවිට යෝජනා වී ඇත. දැනට අර්ධ වශයෙන් ක්‍රියාත්මක වන සියලුම මෘදුකාංග එම කළමනාකරණ තොරතුරු පද්ධතියට අන්තර්ග්‍රහණය කිරීමේ හැකියාව පිළිබඳ තොරතුරු තාක්ෂණ විශේෂඥයින්ගෙන් විමසන ලදුව ඔවුන් විසින් එම මෘදුකාංග ඒකාබද්ධ කළ හැකි බවට තහවුරු කර ඇත. ඒ අනුව මෙම මෘදුකාංග කළමනාකරණ තොරතුරු පද්ධතිය හා ඉහත පද්ධතීන් වැඩි දියුණු කර ඒකාබද්ධ කර භාවිතයට ගැනීමට නියමිතය.

2.3 වෙනත් කරුණු

(අ) නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් පනතේ, 2018 ඔක්තෝම්බර් මස සංශෝධන සහිත කෙටුම්පත අධිකාරිය වෙත එවා ඇති අතර සාකච්ඡා වට කිහිපයකින් අනතුරුව, නීති කෙටුම්පත් දෙපර්තමේන්තුව විසින් නැවත සංශෝධිත කෙටුම්පත අධිකාරිය වෙත යොමු කර ඇත. එකී සංශෝධිත කෙටුම්පත සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා වාර කිහිපයක් පවත්වන ලදි.

නව අමාත්‍යවරයා හරහා අමාත්‍ය මණ්ඩලය වෙත සංශෝධිත කෙටුම්පත ඉදිරිපත් කරලීමට කටයුතු කරන ලෙස නීතිපති දෙපාර්තමේන්තුව විසින් උපදෙස් ලබා දී ඇති පරිදි 2023.04.18 වන දින 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත සංශෝධනය සම්බන්ධව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ගරු වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍ය නලින් ප්‍රනාන්දු මහතා විසින් ඉදිරිපත් කර ඇත. ඒ සඳහා 2023.05.02 වන දින අමප/23/0771/627/013 අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් පනත සංශෝධනය සඳහා අනුමැතිය ලැබී ඇත .

ඒ අනුව,අධිකාරියේ නිලධාරීන් විසින් කාලීන අවශ්‍යතා මත පනතට සිදු විය යුතු සංශෝධන පිළිබඳ නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර කෙටුම්පත් කර ඇති අවසන් සංශෝධනය 2024.02.05 වන දිනැතිව නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කර ඇත. එම කෙටුම්පත සඳහා කිසිදු විරෝධතාවයක් නොමැති බව වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශ ලේකම් විසින් 2024.02.09 දිනැති ලිපිය නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ කෙටුම්පත් සම්පාදක වෙත යොමුකරමින් දැනුම් දී ඇත.

තවද 2024.02.13 වන දිනැති ලිපිය මඟින් වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශ ලේකම් විසින් 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත සංශෝධන කෙටුම්පත නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.එහිදී වත්මන් ආර්ථික තත්ත්වය මත පනත සංශෝධනය කඩිනම් කිරීමට අවශ්‍ය සහය ලබාදෙන මෙන් අමාත්‍යාංශ ලේකම්තුමා විසින් නීතිපතිතුමාගෙන් ඉල්ලීම් කර ඇත . මේ වනවිට නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් කණිෂ්කා ද සිල්වා මහත්මිය විසින් පනත් කෙටුම්පත අධ්‍යනය කර 2024.04.05 දින අමාත්‍යාංශ ලේකම් වෙත නීරික්ෂණ යොමු කර තිබූ අතර, වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය විසින් අධිකාරිය වෙත ඉදිරි කටයුතු කිරිම සඳහා එකී නීරික්ෂණ 2024.04.10 දින යොමු කර ඇත. ඒ අනුව අධිකාරිය විසින් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත ඒ සම්බන්ධව ඉදිරි පියවර සඳහා නිර්දේශ යොමු කිරිමට නියමිතව ඇත.

සංශෝධන වීමට නියමිත වගන්තින්,

1. 2
2. 3 (1),(2)
3. 6
4. 8 (අ) (i),(ආ),(ඒ),(ක),(ග)
5. 10
6. 11
7. 13 (1),(2),(3),(4),(6)
8. 14
9. 18 (1),(2),(3)
10. 19 (1),(2)
11. 20
12. 24
13. 26
14. 27
15. 28
16. 29
17. 30
18. 31
19. 32
20. 34
21. 35
22. 36
23. 39
24. 41
25. 49
26. 58
27. 60
28. 71
29. 72
30. 75

(ආ) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාල 25 ක් පවතින අතර, එහි සමස්ත විමර්ශන නිලධාරීන් 450 සිටිය යුතු වුව ද, දැනට සක්‍රීය රාජකාරියේ යෙදී සිටින විමර්ශන නිලධාරීන් ගණන 282කි. එම නිලධාරීන් සංඛ්‍යාව තුළින් පාරිභෝගික අධිකාරිය පනතෙහි සියලු විධිවිධාන ආවරණය කර ගතයුතු අතර, වැටලීම් රාජකාරීවලට අමතරව එම නිලධාරීන්ට මිල සමීක්ෂණ, දැනුවත් කිරීම්, පාරිභෝගික පැමිණිලි විමර්ශන සහ අධිකරණ රාජකාරී කටයුතු සඳහා සහභාගී වීමට සිදුවේ. එවැනි තත්ත්වයක් තුළ පනතෙහි සියලුම වගන්ති ආවරණය කරමින් වැටලීම් කටයුතු සිදු කිරීම ප්‍රායෝගිකව දුෂ්කර වන අතර, කළමනාකරණයට ද මේ ගැටලුව සම්බන්ධව නිරීක්ෂණය වී ඇති අතර, එම දුර්වලතාවයන් හඳුනාගෙන 2024 වර්ෂයේ සිට වැටලීම් සිදු කිරීමේ දී වැටලීමේ වගන්ති ප්‍රකාරව රාජකාරී ඉලක්කයන් නියම කර ඇත. කෙසේ වුවත්, එක් එක් කාලසීමාවේ දී සිදුවන කාලීන පාරිභෝගික ගැටලු සඳහා ප්‍රමුඛතාවයන් ද ලබාදෙමින් අධිකාරිය පනතේ වගන්ති ප්‍රකාරව වැටලීම් ඉලක්ක සපුරාගත යුතු බවට උපදෙස් ලබාදී ඇත.

(ඇ) 2022 වර්ෂයේ දී නිකුත් කරන ලද 2278/02 දරන ගැසට්පත්‍රය මඟින් කිරි සම්බා සඳහා පාලන මිලක් පනවා තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ දී රට තුළ කිරි සම්බා පරිභෝජනයට සාපේක්ෂව නිෂ්පාදනයේ යම් අඩුවක් දක්නට ලැබුණි.පරිභෝජනයේ ප්‍රමුඛතාවය අනුව අනෙකුත් සහල් සඳහා වැටලීම් 3550ක් සිදුකරන ලදී. කෙසේවෙතත් පාරිභෝගික පැමිණිලි හා වෙළෙඳපොල වැටලීම් මඟින් කිරි සම්බා වැටලීම් 596ක් සිදු කර ඇත. මීට අමතරව කිරි සම්බා පිළිබඳ තොග ගබඩා පරීක්ෂාව ද දිස්ත්‍රික් මට්ටමින් සිදු කරන ලදී. මෙම සියලු කටයුතු සිදු කරනු ලබන්නේ අධිකාරියේ ප්‍රමාණවත් විමර්ශන නිලධාරීන් සංඛ්‍යාවක් නොපවතින පසුබිමක සහ ඉහත සඳහන් සීමාකාරී සාධක යටතේ ය.කෙසේ වුවද ඉදිරි විමර්ශන සැලසුම් ක්‍රියාත්මක කිරීමේ දී මෙම කරුණු පිළිබඳව ප්‍රමුඛත්වය ලබාදී වැටලීම් ඉලක්කගත සැලසුම් සකස් කර ඇත.

(ඈ) ඉහත (අ) සඳහන් ආයතනික සීමාකාරී තත්ත්වයන් යටතේ වෙළෙඳපොළ තුළ ප්‍රායෝගිකව පවතින ගැටලු සඳහා ප්‍රමුඛතාවය ලබාදෙමින් කටයුතු කළ අතර, එම කාලවකවානුවේ දී ගෑස් සම්බන්ධව ලද පැමිණිලි සංඛ්‍යාව මත වැටලීම් සිදුකරන ලදී.

(ඉ) වාර්තාවේ ඡේදය අනුව, අනාරක්ෂිත, තත්ත්වයෙන් බාල නිපැයුම්වලින් පාරිභෝගිකයන්ගේ ආරක්ෂාව සහතික කිරීම පිණිස මෙන්ම වෙළෙඳපොළට පැමිණෙන ව්‍යාජ/කූට නිෂ්පාදනවලින් පාරිභෝගිකයන් සහ සැබෑ නිෂ්පාදකයන් ආරක්ෂා කිරීම සඳහා අධිකාරිය වෙත ලැබී තිබූ පැමිණිලි හේතුවෙන් තාක්ෂණය පාදක කරගත් පාරිභෝගික ආරක්ෂණ ව්‍යාපෘතියක් හඳුන්වාදීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් පුවත්පත් හා වෙබ් අඩවිවල ලංසු කැඳවීමෙන් අනතුරුව තෝරා ගනු ලැබූ ස්විට්සර්ලන්තයේ SICPA සෙකියුරිටි සොලුයුෂන්ස් එස් ඒ සමාගම සමඟ "'විසඳුම් සැපයුම් ගිවිසුමකට" එළඹ තිබේ.

එකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පහසු කිරීම සඳහා, අදාල ගිවිසුම පරිදි 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව අධිකාරිය විසින් විධානයක් (විධාන අංක 49) නිකුත් කර තිබෙන අතර එකී විධානයේ සඳහන් නිශ්චිත නිෂ්පාදනවලට අදාළ නිෂ්පාදකයන්ට, බෙදා හරින්නන්ට, වෙළඳුන්ට සහ ආනයනකරුවන්ට එහි දක්වා ඇති පටිපාටියට අනුකූලව කටයුතු කරන ලෙසට එම විධානය මඟින් විධාන කෙරේ.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම ආරම්භ වීමට නියමිත දිනට පෙර, ශ්‍රී ලංකා ජල බෝතල් නිෂ්පාදකයින්ගේ සංගමය, බීම වර්ග නිෂ්පාදකයින්ගේ සංගමය සහ රූපලාවන්‍ය නිෂ්පාදකයින්ගේ සංගමය යන සංගම් විසින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, එහි සභාපති, සමුපකාර සහ අභ්‍යන්තර වෙළඳාම පිළිබඳ ගරු අමාත්‍යතුමා සහ නීතිපතිවරයා අනුපිළිවෙලින් 01 වැනි සිට 04 වැනි වගඋත්තරකරුවන් ලෙස නම් කරමින් අභියාචනාධිකරණයෙන් රිට් ආඥාවක් ඉල්ලා අංක CA (writ) 281/14 දරන අයදුම්පත ගොනු කරන ලදී.

එකී අයදුම්පත මඟින් පෙත්සම්කරුවන්, එකී 2014.02.24 දිනැති අංක 49 දරන විධානය අහෝසි කිරීමට සර්ටියෝරරි රිට් ආඥාවක් සහ තහනම් රිට් ආඥාවක් ඉල්ලා ඇත. තවද, නඩු විභාගය අවසන් කොට තීන්දුව ලබා දෙන තෙක් අතුරු තහනම් නියෝගයක් නිකුත් කිරීම මඟින් අංක 49 දරන විධානය ක්‍රියාත්මක කිරීම අත්හිටුවන ලෙසත් ඔවුන් ඉල්ලා ඇත. 2014.08.15 වන දින මෙම නඩුව ගරු අභියාචනාධිකරණය ඉදිරියේ කැඳවීම කර තිබිණ. එදින නඩුවේ වික්තිකාර පාර්ශවය වෙත නොතීසිය ගරු අභියාචනාධිකරණය විසින් නිකුත් කර ඇත. ඒ අනුව, නඩුව නැවත කැඳවීම සිදු කරන ලද 2014.08.29 දින පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුව ගරු අභියාචනාධිකරණය ඉදිරියේ පෙනී සිටීමින් මෙම පෙත්සමට එරෙහිව අවශ්‍ය වුවහොත් විරෝධතා ගොණු කිරීමේ අයිතිය රදවා ගෙන ඇත. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් 2014.12.05 වන දින විරෝධතා ගොනු කරමින් පෙත්සම නිෂ්ප්‍රභා කරන ලෙස ඉල්ලීමක් සිදු කර ඇත. එසේම 2014.08.27 වන දින මෙම නඩුව සඳහා ඇතුළත් වීමට (Intervene) ඉල්ලීමක් සිදු කරමින් SICPA සෙකියුරිටි සොලුයුෂන්ස් එස් ඒ සමාගම විසින් මෝසමක් ගොනු කර ගරු අභියාචනාධිකරණයන් ඉල්ලීමක් සිදු කර ඇත. එහිදී අභියාචනාධිකරණය විසින් SICPA සෙකියුරිටි සොලුයුෂන්ස් එස් ඒ සමාගම වගඋත්තරකරුවකු ලෙස එක්කිරීමට අවශ්‍ය පාර්ශවයක් ද යන ප්‍රශ්නය විමසීම සිදු කරන ලදී.

ඉන් අනතුරුව 2016.07.27 වන දින SICPA සෙකියුරිටි සොලුයුෂන්ස් එස් ඒ සමාගම විසින් ඉල්ලීමක් සිදු කරමින් මෙම නඩුව සඳහා ඇතුළත් වීමට සිදු කර ඇති ඉල්ලීම ඉල්ලා අස්කරගෙන ඇත. ඒ අනුව, වසර 02 ක කාලයකින් පසු එකී විමසීම අවසන්ව ඇත.

එසේම, 2017.03.28 වන දින වාරණ නියෝගය ඉවත් කර ගැනීමට වගඋත්තරකාර පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙනුවෙන් ඉල්ලීමක් කර ඇත. ඒ සඳහා ඉඩ ලබා දී නොමැති අතර, SICPA සෙකියුරිටි සොලුයුෂන්ස් එස් ඒ සමාගම ද මෙම ප්‍රමාදය සඳහා සෘජුවම වගකිව යුතු වන බව නිරීක්ෂණය වේ.

එසේම අභියාචනාධිකරණ විසින් පෙත්සම්කරුවන් ඉල්ලා ඇති පරිදි අතුරු සහන ලබාදීම හේතුවෙන්, සැලසුම් කළ පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අධිකාරියට නොහැකි වුණි. එකී අතුරු නියෝග මුළමනින්ම නොතකා හරිමින් ඉහත කී අංක 49 දරන විධානය ක්‍රියාත්මක කිරීමට අධිකාරිය විසින් කවර හෝ පියවරක් ගන්නා ලද්දේ නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105(3) වගන්තියට ප්‍රකාරව "අධිකරණයට අපහාස කිරීම" සම්බන්ධයෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට චෝදනා එල්ල විය හැකිව තිබූ බවත් නිරීක්ෂණය වේ. එසේම එකී නඩුව තවමත් විභාග වෙමින් පවතින අතර, අතුරු තහනම් නියෝග කලින් කලට දීර්ඝ කරමින් පවතී.

ඒ අතරතුර ගිවිසුමෙහි පූර්වගාමී කොන්දේසි සපුරාලීමට වගඋත්තරකරු (අධිකාරිය) අපොහොසත්වීම යන හේතුව මත SICPA සෙකියුරිටි සොලුයුෂන්ස් එස් ඒ සමාගම විසින් ගිවිසුම අවසන් කරනු ලැබූ අතර, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් 'සුරක්ෂිත නිරීක්ෂණ සහ සෙවුම් පද්ධතිය' ක්‍රියාත්මක නොකිරීමේ ප්‍රතිඵලයක් ලෙස පැන නැගුණු ආරවුල සම්බන්ධයෙන් 2018.07.30 දින අන්තර්ජාතික වාණිජ මණ්ඩලයේ අන්තර්ජාතික බේරුම්කරණ අධිකරණයේ අංක 23829/HTG දරන බේරුම්කරණ කටයුත්තක් SICPA සෙකියුරිටි සොලුයුෂන්ස් එස් ඒ සමාගම විසින් ගොනු කරන ලදී.

මෙම කාරණය පිළිබඳව දැනුවත් කිරීම සඳහා අංක 2020/05 සහ 2020.08.17 වන දින දරන අමාත්‍ය මණ්ඩල සංදේශය, අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. අංක අමප /20/1182/313/001 සහ 2020/09/03 අමාත්‍ය මණ්ඩල තීරණය සහ මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ අංක MOF/DG/LAD/CO/47/2020 සහ 2020.08.26 යොමු කර ඇත.බේරුම්කරණ නඩු විභාගය වර්ෂ 2020 දී කොළඹදී පැවැත්විණි. එකී බේරුම්කරණ කටයුත්ත 2020 අගෝස්තු මස 20 දින සිට 29 දින දක්වා ද, 2020 සැප්තැම්බර් මස 12 දින ද, 2020 ඔක්තෝබර් මස 21 -23 දක්වා ද, දෙසැම්බර් මස 04 වන දින

ලිඛිත දේශන සඳහා ද, දෙසැම්බර් මස 21 දින පිළිතුරු දේශන සඳහා ද කැඳවිණි.මෙම බෙරුම්කරණ නඩුවේ ප්‍රදානය 2022.05.10 වන දින ලබා දෙන ලද අතර, එකී ප්‍රදානයට අනුව රුපියල් බිලියන 2.176 ක් ගිවිසුම කඩකිරීම මත අධිකාරියට ගෙවීමට නියම කර ඇත.එකී ප්‍රදානයට එරෙහිව නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් මත පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් CHC 626/2023 නඩුකරය 2022 ජූලි 07 වන දින පවරා ඇත.

එකී ප්‍රදානය ක්‍රියාත්මක කරවා ගැනීම සඳහා පෙත්සම්කාර SICPA සෙකියුරිටි සොලියුෂන් එස් ඒ සමාගම විසින් CHC 569/2023 නඩුකරය 2023 මැයි 16 වන දින කොළඹ වාණිජ මහාධිකරණයේ ගොනු කර ඇත.මෙම නඩු ද්විත්වය සඳහාම පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුව පෙනී සිටින ලද අතර, මෙම නඩු දෙකම 2024.06.12 දින වාචික විවාදය සඳහා කැඳවූ අතර නියෝගය සඳහා 2024.07.26 දින කැඳවීමට නියමිත වේ.මේ වනවිට මෙම ගිවිසුම ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් යම් අක්‍රමිකතා සිදුව ඇත්දැයි සලකා බැලීමට පාරිභෝගික අධිකාරිය විසින් පරීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇති අතර, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා ද, මේ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කරන ලෙස ඉල්ලීමක් සිදු කර තිබූ අතර, එම ආයතනය විසින් එය ඔවුන්ගේ විෂයපථයට අදාළ නොවන බව දැනුම් දුන් අතර, ඔවුන් විසින්ම මෙම කටයුත්ත අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත යොමු කර ඇති බව මේ වනවිට අප වෙත දන්වා ඇත.

(ඊ) පාරිභෝගික අධිකාරි පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව නියැදි පරීක්ෂාවේ දී වැඩි අවධානයක් යොමු කරන ලද්දේ වෙළෙඳපොලේ ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණ දෙන ලද පාරිභෝගික භාණ්ඩ සඳහා වේ. ඒ අනුව, ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්කගත නියැදි පරීක්ෂාව සපුරාගෙන ඇති අතර, එහි දී යම් සීමාවීමක් සිදුව ඇත්තේ අයවැය ප්‍රතිපාදන සීමාවන් යටතේ බාහිර රසායනාගාරවලින් මෙම පරීක්ෂාවන් සිදු කිරීම හේතුවෙනි.

(උ) ඉහත (අ) සඳහන් ආයතනික සීමාකාරී තත්ත්වයන් යටතේ වෙළෙඳපොල තුළ එක් එක් කාලවකවානුවේ උද්ගතවන ප්‍රායෝගික ගැටලු සඳහා ප්‍රමුඛතාවය ලබාදීම මෙන්ම ආයතනික අරමුණු ළඟාකර ගැනීමේ දී සිදු කළ යුතු රාජකාරීන් හා සාමගාමීව ලැබෙන බිත්තර මිල පිළිබඳ පැමිණිලි මත හා වෙළෙඳපල තුළ බිත්තර හිඟය පිළිබඳ නිරීක්ෂණයේ දී සිදු කරන හඳුනාගැනීම් මත මෙම වැටලීම් සංඛ්‍යාව සිදු කරන ලදී.

(ඌ) එම්.එස්.එම් ෆවුසර් නම් නිලධාරියා සේවයෙන් ඉවත් කිරීමේ දී විධිමත් ක්‍රමවේදයකින් තොරව සිදු කිරීම හේතුවෙන් ඔහු විසින් අභියාචනාධිකරණයේ දී නඩුවක් ගොනුකර තිබුණි. එහිදී අධිකරණ නියෝගය ප්‍රකාරව ඔහුට හිඟ වැටුප් ගෙවීමට තීන්දු කර තිබුණි. ඒ අනුව, අධිකාරිය විසින් එම නිලධාරියා වෙත හිඟ වැටුප් ගෙවීමක් සිදු කර ඇත.

(එ) සෑම වෙළෙන්දෙකුම අධිකාරියෙහි ලියාපදිංචිය සඳහා දත්ත පද්ධතියක් නිර්මාණය කර ගැනීමට අවශ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි මූලික පියවර සිදු කර ඇත. වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය මඟින් ඒ සඳහා මේ වන විටත් කමිටුවක් පත්කර ඇත. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් කෙටුම්පත් කර ඇති යෝජනා පත්‍රය එම කමිටුව මඟින් සළකා බලා අවශ්‍ය වැඩි දියුණු කිරීම් සිදු කිරීමට නියමිතය.

තරඟකාරිත්ව ප්‍රවර්ධන අංශය මඟින් ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටා ඇති ව්‍යාපාර ලියාපදිංචි කර ගනිමින් එහි නියමු ව්‍යාපෘතිය සිදු කර තිබේ.

(ඒ) අධිකාරියේ පැවති පුරප්පාඩු තනතුරු සඳහා සුදුසු අය වහාම බඳවා ගැනීමෙන් එම අරමුණු කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අධිකාරිය විසින් මේ වනවිටත් උපරිම පරිශ්‍රමයෙන් කටයුතු කර ඇති බව දන්වා සිටිමි.

එනම්, අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් එම පුරප්පාඩු තනතුරු බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම් මඟින් අංක

CAA/HRA/DMS/Rec/2023 හා 2023.07.07 දිනැති ලිපිය යොමු කර ඇති අතර, ඒ සඳහා අමාත්‍යාංශ ලේකම් විසින් MT/DEV/09/01/07-36 හා 2023.08.23 දිනැති ලිපිය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත නිර්දේශ ලබාදී ඇත.

තවද, ඉහත පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමට අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිර්දේශ ලබා ගැනීම අවශ්‍ය බව අංක PMO/SEC/09/02 හා 2024.04.22 දිනැති එම කාර්යාලය විසින් නිකුත් කළ චක්‍රලේඛයේ සඳහන් කර ඇති බව අවධාරණය කරමි.

ඉහතින් සඳහන් පරිදි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමට අනුමැතිය ඉල්ලා සිටීමේ ලිපියට අතිරේකව අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අමාත්‍යාංශ ලේකම් මඟින් තවත් ලිපියක් 2024.02.26 දින අංක CAA/HRA/DMS/Rec/2024 මඟින් යොමු කරමින් එදිනට පැවති පුරප්පාඩු තනතුරු සඳහා අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව ද දන්වා සිටිමි.

ඒ අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සහ අග්‍රාමාත්‍ය කාර්යාලයේ අනුමැතීන් ලද පසුව එම පුරප්පාඩු තනතුරු සඳහා කඩිනමින් බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු අධිකාරිය සිදු කිරීමට නියමිත බව වැඩිදුරටත් දන්වා සිටිමි.

හේමන්ත සමරකෝන්
සභාපති
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

Consumer Affairs Authority,

1st and 2nd floor, CWE Building,

No.27, Vauxhall Street,

Colombo 02.

Sri Lanka.

Tel : +94117755486

Fax : +94 112 399 148

Email : chairman@caa.gov.lk

dg@caa.gov.lk

https://www.facebook.com/CAASriLanka

https://www.youtube.com/@ConsumerAffairsAuthority

http://www.caa.gov.lk

Department Of Government Printing